"හිං ගඟ කියන්නෙ අපේ ජීවිතය. අපි ජීවිතේට වගේම ගඟට ආදරෙයි. අවුරුද්දට දෙතුන් පාරක් ගඟ ගලනවා. සමහර වෙලාවට අපේ දේපොළත් ගහගෙන යනවා. ඒත් අපි ගඟට බනින්නෙ නෑ. ආයෙත් අපට දේපොළ ලබා දෙන්නෙ ගඟ."

ISBN 955-21-1055-6
11/16
00082150-14 Rs.190/-

Buy online www.mdgunasena.com
Find us on Facebook
iRead Call 0774 447 227- we now deliver to your doorstep

Scanned by CamScanner

1974 රාජ්‍ය සම්මාන දිනූ යොවුන් නවකතාව

# පූරු යාළුවෝ

ලාල් ප්‍රේමනාත් ද මැල්



Scanned by CamScanner

# මෙම කතෘගේ වෙනත් පොත්

## නවකතා

සාප ලද්දෝ
ජීව තණ්හා
ප්‍රේමතෝ ජායතී සෝකෝ
නැත ලොවේ අන් රසඳුනා
එලොවින් බිඳක් ගෙන ආමි

## කෙටිකතා

ජීවිතයේ හැටි
මේ මිනිස්සු

## නිබන්ධන

රතන දීප
අපේ අපූරු විත්ති
ගිනි පුපුරු
ජාතික සංදර්ශනය
මනෝරම්‍ය ලංකා

## ළමා පොත්

පූංචි අයගෙ පූංචි කතා
චූටි චූටි කුරුළු කතා
වීර ළපැටියෝ
ඇලිසාවගේ අපූරු රට
සංචාරක කතා
අහුටු මිට්ටා
දෙවියන්ගේ පුදුම තෑග්ග
දෙව් ලොව ගිය චූට්ටා

## සාහිත්‍ය විචාර

සාහිත්‍යයේ අලුත් මුහුණුවර
සාහිත්‍ය මුහුණු
ජ්‍යෙෂ්ඨ සාහිත්‍ය විචාරය
පොදු සහතික සාහිත්‍යය
රත්නාවලී - ගිරා යතුර
කුසද තතුව

Scanned by CamScanner

# 1

ඉරබැස ගෙන යන්නට ළංවී තිබිණි. ආකාසය හරියට කැකෑරුණු ලෝදිය හැළියක පෙනුමයි. හරියට සිත්තරකු නොසැලකිල්ලෙන් අඳින ලද සිත්තමක් වගෙයි.

මට නිසැකව ම අවුරුද්ද හෝ මාසය හෝ කියන්නට තරම් මතක නැත.

මගේ මාමා කෙනෙකු දකුණු පළාතේ ප්‍රධාන නගරය වූ ගාල්ලේ සිට සැතපුම් පහළොවක් පමණ ඈතින් පිහිටි උඩුගම තේ වත්තක රැකියාව කළේය. සමහර පාසැල් නිවාඩු කාලවලට මාමාත් සමඟ නිවාඩුව ගත කරන්නට ලැබීම මට මේ කථාව කියන්නට ඉඩ ලබා දීමක් විය.

නිවාඩු කාලය ලබන්නට දින දෙක තුනකට කලින් පාලිත ගෙන් මට ලියුමක් ලැබීම සාමාන්‍ය සිරිත විය. නිවාඩු කාලයට නොවැරදීම උඩුගම එන්නැයි ඔහු ඇවිටිලි කරයි. මා උඩුගම ඔවුන්ගේ ගෙදරට පැමිණෙන තුරු පාලිත පෙර මඟ බලා සිටින බව මම දනිමි.

ඔහු ගාල්ලේ සාන්ත ඇලෝසියස් විද්‍යාලයේ නේවාසිකව සිටි අතර වාරය අවසානයෙහි පමණක් ගෙදර යාමට පුරුදු වී සිටියේය. ගෙදර ගියද ඔහුට කථා කරන්නට හෝ සෙල්ලම්

Scanned by CamScanner



ඔහු ගාල්ලේ ශාන්ත ඇලෝසියස් විද්‍යාලයේ නේවාසිකව සිටි අතර වාරය අවසානයෙහි පමණක් ගෙදර යාමට පුරුදුව සිටියේය.

කරන්නට සහෝදර සහෝදරියෝ කිසිවෙක් නො වූ හ. විශාල වත්තක් මැද තරමක් උස කඳු ගැටයක පිහිටි මේ ගෙයට හැම පැත්තෙන් ම පෙනුනේ තිල් පැහැයෙන් වැසී ගත් තේ පඳුරුය. ළඟ පාත ගෙයක් ද නො වී ය. පාලිත මට වඩා අවුරුදු දෙකකින් පමණ වැඩිමහලු විය. එහෙත් ඔහු මා වගේ දෙදෙනෙකි. එකල මගේ වයස අවුරුදු දොළහක් පමණ වූ හයි සිතමි. පාලිත මෙන් නො ව කුඩා කාලයේ සිට ම මම වයසටත් වඩා කුඩා වීමි. කුඩා වුව ද නිරෝගි ශක්තිමත් ශරීරයක් මට තිබුණු බව මම දනිමි.

පාලිත මුණ ගැසුණේ මාස ගණනාවකට පසු හෙයින් අප දෙදෙනාට කථා කරන්නට නොයෙක් දේවල් තිබිණි. එද ගෙදර සිටියේ පාලිතත් වැඩකාර ළමයාත් පමණකි. අපට කථා කරන්නට නොයෙක් දේවල් තිබුණා පමණක් නො ව අපි ඒ හැම දෙයක් ගැනම කථා කළෙමු. මාමා රැකියාවට ගොස් සිටි අතර නැන්ද කඩ මංඩියට ගොස් පැමිණියේ මා ගොස් පැය තුනකට පමණ පසුය. අපි බොහෝ වේලාවක් සුහද අන්දමින් කතා කරමින් සිටි අතර හදිසියේ ම පාලිත කණගාටුව පිරීගත් මුහුණක් ආරූඪ කරගෙන මා සමඟ මෙසේ කී ය:

'ජයා, අපේ අම්මට වුවමනා කරල තියෙන්නෙ මාව දොස්තරයෙක් කරන්න. අම්ම කියනව කොහොම හරි පාඩම් කරල දොස්තර කෙනෙක් වෙන්නලු. මට නම් පෙන්නන්න බෑ.'

'ඇයි පාලිත දොස්තර කෙනෙක් වෙන්න තියෙන අකමැත්ත? දොස්තර කෙනෙක් වුණාම හොඳ නෙ?'

Scanned by CamScanner

හදිසියේ ම සිසිවකුගේ අඩි ශබ්දයක් ඇසුණෙන් අප දෙදෙනා ම සැලකිලිමත් වූයේ පැමිණියේ කව්ද යන්න දනගන්නටය. කිසියම් සිත් ගන්නා සුලු පෙනීමක් නැති වුව ද ඔහු කඩමාලු පොරවාගත් කාලකණ්ණි පෙනීමක් ඇත්තෙක් නොවී ය. පෙනීමෙන් බුද්ධිමත් බවක් පෙණුනු හේ වයසින් අවුරුදු හතලිස් පහක් හෝ ඊට ස්වල්පයක් හෝ අඩු වැඩි වන්නට ඇත. මේ ගෙදරට හේ අමුත්තකු නොවන බව පෙනුණ නමුත් ගෙදර නතර වී සිටි අයකු නම් නොවන බව මට සහතික ය.

'කොල්ලෙකුට තමන් කැමැති දෙයක් ඉගෙනගන්න දුන්නම තමයි සන්තෝසයක් ලබන්න පුළුවන්.'

ඔහුගේ මුව'ගට යන්තම් සිනාවක් අරක්ගත්තේය.

'මේ ළමයින්ට මම කියන්නෙ තමන්ට වැඩියෙන් හුරු රස්සාවල් කරන එක තමයි වැඩිය හොඳ. නුපුරුදු දේවල් කරන්න හිත යන්නෙ ඒව නුහුරු බරපතල දේවල් නිසා. කොහොමත් පුරුදු දේ නේද වැඩිය ලේසි?'

ඔහු අපෙන් පිළිතුරක් බලාපොරොත්තු වූයේ නො වේ. ඒ නිසාම තවත් එහි නො සිට පිටත් වී ගියේය.

මම මද වේලාවක් ඔහු යන සැටි බලා සිටියෙමි. ඔහු සෙමෙන් සෙමෙන් පා තබා යයි. ඔහු එක් අඩියක් ඔසවා අනෙක තබන විට 'ටක්' යන හඬින් ඇට කැඩෙන ශබ්දයක් ඇසේ. පොළවට බයෙන් මෙන් ඔහු අඩි තබන්නේ මන් ද?

'ඒ කවුද පාලිත?'

"ආ-එයාද? ඒ මිනිහ හැම රට රාජ්ජෙකම කරක්ගහපු මහ සෝණ ගෙන් බණ අහපු ජාතියෙ මිනිහෙක්. ඒත් මිනිහට නම් මිනිහෙක් වෙන්න ලැබිල නෑ. එයා නිකම්ම ඇට්ටකුණාවෙච්ච මිනිහෙක්."

පාලිත ගේ මේ විස්තරයත් ඔහුගේ ගමන් විලාසයත් මඳ වේලාවක් බලා සිටීමෙනුත් ඔහු කවර විධියේ මිනිහෙක් දැයි මට චිත්‍රයකින් මෙන් පෙනෙන්නට විය.

ඒ මිනිහා ගැන තව දුරටත් සිතීමෙන් ඇති පලය කුමක්ද? ඔහු පරාජිත මිනිහෙකි. පරාජිතයා ජයග්‍රාහකයා ගැන සිතන්නේ අමුතුම අන්දමකටය. ජයග්‍රාහකයා තව තවත් ඉහළට නඟින්න මාන්සි ගතියි. ඉහළට නැඟීමේ ආසාව මිස එහි ඇති අගය ගැන ඔහුට සිතන්නට අවස්ථාවක් නැත. එහෙත් පරාද වූ මිනිහා ජයගැනීමේ වටිනාකම තේරුම් ගෙන ඇත. එහෙත් මේ සත්‍යය, මේ ඇත්ත, හරි තේරුම් ගන්නට තරම් බුද්ධියක් එදා මා තුළ නො වී ය.

කථාව වෙනත් අතකට හරවන්නට අවශ්‍ය වූ නිසා මම ගම ගැනත් ගමේ වෙනත් මිනිසුන් කිහිප දෙනෙකු ගැනත් පාලිත සමඟ කථා කළෙමි. මෑතක දී ප්‍රදේශයේ නොයෙක් එළවුළු වගී වගා කොට ඇති අතර කුකුළන් හා ගවයන් ද සිය ගණනක් සිටින බව ඔහුගෙන් දැන ගතිමි. උඩුගමට සැතපුම් කිහිපයක් එහායින් පිහිටි මේ ගොවිපළ අසල ලස්සන කඳු වැටියක් තිබෙන බව ද ඔහු විස්තර කළේ ය. ගොවිපළ බැලීමට මෙන් ම මේ කඳුවැටිය නැඟීමට ද මා තුළ ගුප්ත ආසාවක් ඇති විය.

පාලිත විසින් සුරංගනා කථාවක් බඳු මේ ලස්සන කඳු වැටියත් ඒ අවට ප්‍රදේශයත් සම්බන්ධයෙන් කළ විස්තර...

Scanned by CamScanner

... ආරක්ෂා සහිත මේ ප්‍රදේශය සම්පූර්ණයෙන් ම පාහේ කඳු නිම්නයන්ගෙන් පිරී තිබෙන බව ඈත සිට ම පෙනේ.

මේ කඳු වැටිය අසලින් ලස්සන ගිං ගඟ ගලා යන අන්දම ද ඔහු විස්තර කළේ ය. කඳු වැටිය පිළිබඳ ව පාලිත දරන අදහස්වලට වඩා එහෙම පිටින් ම වෙනස් අදහස් මා තුළ ඇති විය.

'නෑ පාලිත, ඔයාගෙ අදහස් වැරදි වෙන්නට පුළුවන්. ලංකාවේ විශාලතම වනය සිංහරාජ අඩවිය පටන් ගන්නෙ ඔතැනින්. මම භූගෝල විද්‍යාව පාඩමේ දී සිංහරාජ අඩවිය ගැන හුඟක් කරුණු ඉගෙනගත්ත. දැන් මට ආසයි ඒක හොඳට බලා ගන්නත්.'

'ජයා, කන්දක ගලුත් පසුත් ඇති. කැලෑවේ නම් ලොකු ගස් තියේවි. ඕවායෙ මොනව බලන්නද?'

'නෑ පාලිත, මේ කන්දෙ ගලුත් ඇරෙන්න ඊට වඩා වැදගත් දේවල් තියනව. කන්ද මුදුනේ ගුහාවත්

Scanned by CamScanner

ඖපපර ගුහාවන් ගොඩක් තියනව ඒ
ඇහැව්වෙත් අදයි. මම දවස් දෙක තුනක් ම
ගියා ගහ දිගේ ඉහළට. කොහොම වුණත්
විශ්වාසයි. මිනිස්සු හිතාගෙන ඉන්න තැනි
ගහ පටන් ගන්නෙ.'

'මම හිතනව තමුසෙ හොඳ ඉං
වෙයි කියල.'

'මම හිතනව තමුසෙ හොඳ පුරා
වෙයි කියල. අර ඇට්ටකුනාවෙච්ච මිනිහ
මතක නේ?'

'අල්ලල දනව පරාජිතයෙක්ගෙ

පාලිතගේ කථාවත් ඔහුගේ ඉරියව් ආදිය
විට මා තුළ ඇතිවුණේ සන්තෝෂයකි. ඔහු
බලාපොරොත්තු සහගත ව සිටී ද? ඔහු මාත
කළ නොහැක්කේ කුමක් ද? 'අපි අලුත්
ගනිමු' යන අධිෂ්ඨානය මගේ සිතේ පැලපදි

එදා දවල් කෑම මේසයේ දී අප කරන්න
හෝ අපේ බලාපොරොත්තු ගැන හෝ කිසි

Scanned by CamScanner

නො කරන්නට පරෙස්සම් වීමු.

නැන්දට වුවමනා කර තිබුණේ පාලිත දෙස්තරකු කිරීමට ය. ඇගේ බලාපොරොත්තු වෙනස්කර ගන්නට ඈ කැමති නොවන බව පාලිත මා සමහ කියා තිබුණි. දෙස්තරකු වීමට පාලිත තුළ ආසාවක් නො වී ය. ඔහුට වුවමනා වූයේ ඉංජිනේරුවෙකු වීමට ය. කැම ගනිද්දී හෝ වැඩිහිටියන් අතර සිටිද්දී අප කරන්නට යන දේ ගැන කතා බහක් නොවීම අපේ වාසියට හේතු වූ බවට සැකයක් නැත.

පසුදු උදයෙහි කෝපි කෝප්පය අතට ගත් පාලිත කථා කරන්නට වූයේ කඳු වැටියත් එහි වූ ගුහාවල් ගැනත් ය. මා එයින් තේරුම් ගත්තේ කලින් දින කථා කළ දේවල් ගැන ඔහු තව තවත් සිතන්නට ඇති බවය.

'ජයා ඔයා මා එක්ක ඇවිදින්න ආවොත් ගිං ගඟේ මොන තරම් වටිනා දේවල් තියෙනවද කියල පෙන්නන්න පුළුවන්. ගඟ දිගට ම මැණික් ඉල්ලම්. එක ගමක් තියෙනව මැණිකාවල කියල. රජකාලෙ ඉඳල ඒ ගමේ මැණික් පතල් තිබුණා කියල මිනිස්සු කියනව.'

'පාලිත සිංහල රජකාලෙ මේ පළාත හුඟක් දියුණුවට තියෙන්න ඇති මම හිතන්නෙ.'

'අපොයි ඔව්. ඉංග්‍රීසි කාරයන් ලංකාව අල්ල ගන්නට පස්සෙ ඇති කරගත්ත උඩරට ගිවිසුමට අත්සන් කරපු අයගෙන් එක්කෙනෙක් තමයි හිතිදුම පත්තුවේ මිල්ලව දිසාව.'

'පාලිත කොහොමද ඒක දැන ගත්තෙ?'

'ජයා මම හිතිදුම කඳු වැටිය දිගේ ඇවිදින්න යන්න ඉස්සෙල්ල මේ පළාත ගැන හුඟක් දේවල් කියෙව්ව. අපේ පුස්තකාලෙ ගොඩගහල තියෙන්නෙ ලංකා ඉතිහාස පොත්. ඇස්.පී. පියතුමාගෙ පුස්තකාලය දුන් අපේ ඉස්කෝලෙටයි අයිති.'

'ගිය පාර මෙහෙ ඇවිත් ගියාට පස්සෙ මාත් හිතිදුම් පත්තුව ගැන තොරතුරු හෙව්ව. ඒ වුණත් පොත්වලින් ඒ තරම් තොරතුරු හොයා ගන්න බෑ.'

'ජයා මම හුඟක් දේවල් දැනගෙන තියෙනව. ඒවා මම පස්සෙ කියන්නම්.'

එදා අපි ගමනට සූදනම් වූවෙමු. ගෙන යාමට සූදනම් කොට තිබූ දේවල් පාලිත මට පෙන්වී ය. ඉටිපන්දම් කිහිපයක් ද ඒවා සවි කිරීමට ලැලි පුවරුවක් ද ගිනිපෙට්ටියක් ද කෑමට පාන්, කට්ලට් හා පැටිස් ද ඇහුරු පෙට්ටියක් ද ඒ අතර විය. පාලිත මේ රැස් කොට තිබූ ද්‍රව්‍ය නිසා මට එක් කරුණක් පැහැදිලි වූයේය. මා හිතාගෙන හිටියාට වඩා මේ කාරිය සෑහෙන අමාරු එකක් බව ය ඒ. පාලිතට ගමන ගැන සෑහෙන අවබෝධයක් තිබූ බව ඒ රැස්කොට තිබූ ආම්පන්නවලින් මම අවබෝධ කොට ගතිමි. මම ඔහුගෙන් කිසිවක් ගැන ප්‍රශ්න නොකළ අතර එකහෙළාම ඔහු සමඟ ගමනට සූදනම් වුණෙමි.

මාමා ගෙන් හෝ නැන්ද ගෙන් ගමනට බාධාවක් නොවී ය. මේ ගමනට නැන්ද බාධා කරතැයි මුලින් මා සිතා සිටි නමුත් ඇගෙන් වුව ද බාධාවක් නො වී ය. 'පරිස්සමෙන්

ගිහින් එන්නැ'යි කියා ඕ කීවාය. ගැමියන් බොහෝ දෙනෙකු මාමා දන හැඳින සිටි හෙයින් ඕනෑ ම කෙනෙකුගෙන් උදව් උපකාර ගත හැකි බව ද ඕ කීවාය.

ගිං ගඟ අයින දිගේ. පනංගල, හිනිදුම, හබරකඩ, දෙල්ලව යන ගම් පසුකොට හිනිදුමට පැමිණියෙමු. හිනිදුම කතෝලික පල්ලිය නිසා ප්‍රසිද්ධව ඇතත් තවමත් අන්ත පිටිසර ගමකි. පල්ලිය ඉදිරියෙන් ඇති ලස්සන කන්ද මුදුනේ කතෝලික මුනිවරයකුගේ පිළිරුවක් ඇත. ඒ වැඳපුදගන්නට අවුරුද්දකට වරක් කතෝලික බැතිමතුන් හිනිදුම කරා ඇදෙති.

ගිං ගඟ සිහින් හඩ නඟා තාලෙට ගලා බසියි. පුංචි දරුවකු වගේ සුරතල් බවක් හිනිදුම තවලම පෙදෙසෙහිදී ගිං ගඟ තුළින් දක්නට ලැබුණත් බද්දේගම පළාතේ දී ගඟ විශාලත්වයෙන් මෙන් ම සැඩ පරුෂ බවෙන් ද වැඩි ය.

රුක්ස මහ වනය ඈතින් පෙනේ. ගඟ දෙපැත්තේ ලඳු කැලෑ ය. තැනින් තැන උක් වගාව සරුවට තිබෙන බව දක්නට ලැබිණි.

'ජයේ ඔයා දන්නවද මෙහෙ තිබෙන හොඳ ම වගාව මොකක් ද කියල?'

'උක් ගස්.'

'අන්න හරි.'

'පාලිත දන්නව ද උක් මේ තරම් සරුවට මෙහෙ වැවෙන්නෙ කොහොමද කියල?'

'නෑ.'

'ගිං ගඟ නිතරම පිටාර ගලනව. ගංවතුර ආවම ඒ එන්නෙ අලුත් පස් එක්ක. දවස් දෙක තුනකින් ගංවතුර බැහැල යනව. එතකොට ඉතිරි වන රොන් මඩ තමයි උක් ගසට පෝර. උක් වගාවට ගිං ගඟ අයින තරම් හොඳ පොළොවක් මේ රටේ නැ කියල අපේ සර් කියල දුන්න. කියුබාවේ වත් මෙච්චර සරුවට උක් වවන්න බෑ කියල අපේ සර් විස්තර කරන කොට මට පුදුම හිතුණා.'

'පව්.'

'ඇයි?'

'එච්චර සරු පොළොවක් අපට තියෙන්නෙ. ඒත් අපි සීනි ගේන්නෙ පිට රටින්.'

'අපේ මිනිසුන්ගෙ කම්මැලිකම.'

තැනින් තැන එක දිගට තිල් පලසක් අතුරුවාක් වැනි තේ වතු රැසක් ම තිබිණි. කුඹුරු ගොවිතැන් ඒ තරම් සරුවට කළ බවක් නොපෙනුණත් අල බතල හා එළවළු කොරටු නම් සෑම තැනක ම විය.

තවලම පුංචි නගරයක් මෙන් සැලකුණත් එහි කඩ තුන හතරකට වඩා දක්නට නො විය. විශාල තේ පැක්ටරි කිහිපයක් නම් තිබුණු බව මට මතකය. පැය තුන හතරක පා ගමනින් පසු දෙණියාය නමින් හැඳින් වූ ගිං ගඟ පටන් ගන්නා කඳු මුදුනට නැග ගන්නට අපට හැකි විය. මේ ස්ථානය ගම් වැසියනට රහසක් නොවන බව එහි වූ නොයෙක් පා සටහන්වලින් ද කඳු පාමුල දී මුණ ගැහුණ මිනිසුන්ගෙන් ද පැහැදිලි වූයේ ය.

අප ඒ ගුහාවට ඇතුළු වන විට අවට කිසිවකු දක්නට නො ලැබිණ. ගුහාවට ඇතුළු වන දොරටුව ගස් කොළන් වැවී ආවරණය වී තිබූ නිසා බොහෝ කලකින් එයට කිසිවකු ඇතුළු නොවූ බව ද විශ්වාස කළ හැකි විය.

පාලිත ගුහාවට ඇතුළු වූ වහාම ඉටිපන්දම් දෙකක් පත්තු කොට ලැලි පුවරුවේ සවි කළේ ය. ගුහාව ඇතුළේ එළියක් නැති ව ගමන් කළ නොහැකි තරමට අඳුරෙන් පිරී තිබිණි. ඉටිපන්දම් දැල්වූ පසු අඳුර පීරාගෙන ඉදිරියට යන්නට අපට හැකි වූයේ ය.

මා කලින් සිතාගෙන සිටියාට වඩා ගුහාව වෙනස් බව තේරුම් ගන්නට වැඩි වේලාවක් ගත වූයේ නැත. ගුහාව ඇතුළත තැනින් තැන විශාල ගල්මුල් පිරී තිබිණි. එහෙයින් ගමන ද අපහසුය.

පාලිත වරින් වර පිටිපස හැරී මගේ මුහුණ දෙස බැලුවා මට මතක ය.

'ජයෙ බය ද?'

'නෑ පාලිත මං බය නෑ' මම ඇහට නොදැනීම කීවෙමි.

'අපෝ මම නං දන් සිය වාරයක් විතර ඇවිල්ල ඇති.'

ඔහුගේ ඒ කථාව මට කළ සරදමක් වැනි ය.

'අපි ගමේ මිනිස්සු. තේරුණාද ජයා? ගමේ මිනිසුන්ට මේක ලොකු දෙයක් නෙවි. ඔය ගොල්ල

එහෙම නෙවි නගරෙ මිනිස්සු. ඔය ගොල්ලට නම් මේක මැජික්, එහෙම නේද?'

'අයියෝ නගරෙ මිනිසුන්ට මීට වැඩිය මැජික් බලන්න තියෙනව.'

විහිළුවෙන් තහළුවෙන් අපි ගුහාව ඇතුළට ම ගියෙමු. මුල දී අපි නොසිතූ තරම් ගුහාව ඇතුළට විහිද ගියේ ය. ඇත්ත වශයෙන් අවුරුදු දහස් ගණනක් පැරණි ගුහාවක් යැයි සිතාගත හැකි තරමට පැරණි වූ නටබුන් ඒ තුළ තිබිණ.

අපේ ඔළුවට දූන් දූන් කඩා වැටෙතියි සිතන තරම් අබලන් වූ ගුහාවේ බිත්ති දෙස අප බැලුවේ සැක සහිතවය.

'මෙන්න ජයා මෙතැනින් දිගටම ගියොත් ගිං ගඟේ මුල සොයා ගන්නට පුළුවන්. මෙතෙන්ට එනකම් මම මීට කලිනුත් ඇවිත් තියෙනව. අර පැත්තට හැරුණොත් කෙළවර කොහෙ ද කියල දන්නෙ නෑ. සමහර විට ඒක ඇතුළෙ ලොකු නිධානයක් තියෙනව ද දන්නෙත් නෑ.'

පාලිත කථා කරන්නේ සන්තෝෂය පිරි ඉතිරි ගත් සිතකිනි. ඉංජිනේරුවකු නොව පුරා විද්‍යාඥයකු අඳුරේ අත පත ගා කිසිවක හැඩ රුව කියන්නාක් මෙන් ඔහු කථා කරයි. ඔහුගේ සමහර අදහස් පිස්සු අදහස් යැයි මුල දී මා කල්පනා කළ ද පසු ව ඒ නිවැරදි තීරණයන් බව මට ද විශ්වාස කරන්නට සිදු විය. ඇත්ත වශයෙන් ඔහු මට වඩා නිර්භීත බව ද මම පිළිගනිමි. අනතුරකට මුහුණ දෙන්නට තරම් ආත්ම ශක්තියක් ඔහු තුළ පැවැත්තේ ය.

Scanned by CamScanner

'ජයේ, විනෝද වෙන්න තරම් කාලයක් නෑ. කොහොම හරි තව ඇතුළට යමු.'

අප එතන ගත කළේ ස්වල්ප වේලාවක් පමණයි. නැවතත් ගමන ආරම්භ කළේ දෙකට නැමී ගෙන ය. හැම විටම පාලිත මට ඉදිරියෙන් ගමන් කරයි. මම ඔහු අනුව යන්නෙමි. ඒ පාර දිගේ දෙකට නැමීගෙන අපට වැඩි දුරක් ගමන් කරන්නට නො ලැබිණි. තවත් ගුහාවකට ඇතුළු වන දොරටුවක් ඉදිරියෙන් පෙනේ. කලින් අප ඇතුළු වූ ගුහාවත් මේ ගුහාවත් අතර ලොකු ම වෙනස වූයේ මේ අලුත හමු වූ ගුහාව මැදින් සුනිමල් ජලධාරාවක් ගලාගෙන යාම ය. මෙහි බිම ද ගල්කැටවලින් හා වැලි තලාවන්ගෙන් ද යුක්ත ය.

මේ ඇළට ටිකක් එහායින් කදිම ආරක්ෂක ස්ථානයක් ද වූයේ ය.

'මට නම් ඔය ඇළ පෙන්නන්න බෑ. ඕක නොතිබුණ නම් අපට මෙතෙන්ට වෙලා රජ සැපට ඉන්න තිබුණ.'

'පාලිත තමුසෙ ලොකුවට හිතා ගත්තට මෙතනට ආවට පස්සෙ මට හිතෙන්නෙ මොන කෙහෙල් මලක් වත් නෑ කියල' මම කීවෙමි.

'උදැල්ලක් තිබුණ නම් මේ වතුර පාර අර ඇළට හරවන්නට තිබුණා.'

මා එසේ කීවේ මඳක් එහායින් මිනිසෙකු ගේ කටක් වැනි විවරයකින් ගලාගෙන ආ වතුර පහර දැකීමෙනි. ඒ විවරයේ වූ කුඩා ගල් කැට හා වැලි ද ඉවත් කළොත් අනුමානයක් නැති ව ම වතුර පාර එතැනට හරවන්නට

Scanned by CamScanner

හැකිවෙතැ යි මම සිතුවෙමි.

'ජයේ ඒක නම් ඇත්ත. හොඳ වැඩක්. මම උදැල්ලක් සොයා ගෙන ඉක්මනින් එන්නම්.'

පාලිත මගේ අදහස ඔය තරම් ඉක්මනට ක්‍රියාත්මක කරතැයි මම නො සිතුවෙමි. ඔහු මගේ මුහුණ දිහා ඇසිපිය නොගසා ටික වේලාවක් බලා ගෙන සිටියේ ය.

'තමුසෙගෙ මොළේ හොඳයි ජයා. බලනව මේක කළා ම මොකද වෙන්නෙ කියල'

ඔහු තවමත් මගේ දිහා බලාගත් ගමන් ම ය.

'මොකද වෙන්නෙ'

මම ඔහුගෙන් ඇසුවෙමි.

'මොකද වෙන්නෙ කියල බලනවකො?'

තව විනාඩි කිහිපයක් ඉදිරියට ගොස් එළිමහනකට පැමිණියෙමු. ඉර එළිය අපේ ඇස් රිදවන්නට විය. බොහෝ වේලාවක් අඳුරු ගුහාව තුළ සිටි නිසා ඉර එළිය දෙස බලන්නට නොහැකි තරම් ය.

'ජයේ මෙතැන ඉන්න. මම ඉක්මනට උදැල්ලක් හොයා ගෙන එන්නම්.'

මම වැල්ලෙහි වාඩි වීමි. පාලිත පිටත් වී ගියේ ය. එහෙත් ඔහු ඉක්මනින් ම ආපසු ආවේ ය. අපි නැවතත් ගුහාවට රිංගා ගතිමු. ඉටිපන්දම් පුවරුව මගේ අතෙහි විය. මුළු ගුහාවට ම එළිය වැටෙන අන්දමට ගල් කුළක් මත ඉටි

Scanned by CamScanner

පත්දම් පුවරුව තබන්නැයි ඔහු මට කීවේ කම්කරුවකුට විධාන කරන ඉංජිනේරුවකු වගෙයි. මම ඔහුට කීකරු වූවෙමි. ඔහු දත් යුහුසුලු ව උදැල්ල ගෙන පොළොව කැපීමෙහි යෙදී සිටී.

සමහර විට අවුරුදු සිය ගණනකට පෙර සිට වුව ද මේ දිය පාර හැරවීමට නොයෙක් උත්සාහයන් ගෙන තිබෙන්නට ඇත. ඒවා අසාර්ථක වූවා විය හැකියි. එහෙත් පාලිත කාර්යය පටන්ගෙන ගත වූයේ පැය බාගයකටත් අඩු කාලයකි. ඔහු කතින ලද මහ ඔස්සේ වතුර ගලා යන්නට විය. වතුර ඔහුට සරදමට මෙන් ගැලීය. ගල් බොරලු ඉවත් කරන්නට ඔහු එක උදලු පාරක් ගසන විට වේගයෙන් ආ වතුර එමෙන් දස ගුණයකටත් වැඩියෙන් මහ පෑ දී ය. අර කලින් කී අඳුරු විවරය තුළින් කවදාවත් නො දුටු විරූ අන්දමින් වතුර ගලා එන්නට වූයෙන් මම කුල්මත් වූවෙමි. මා අත්පොලසන් දෙන්නට වූයේ නොදැනුවත් ව ම ය. විනාඩි දහයක් පමණ වූ සුළු කාලයක් ඇතුළත ඒ දිය කඳ අලුත් විවරයට ගැලී ය. කලින් දිය ගලා ගිය මාර්ගය එහෙම පිටින් ම වියළී ගොස් තිබිණි. එහෙයින් අපට කරදරයක් නැතිව ඒ හරහා ඇවිදින්නට ඉඩ ලැබිණි.

අපි ඉක්මනින් ම ඇළ හරහා ගියෙමු. අපි ඇළෙහි ජල කඳ අන් අතකට හැරවීමට සිත් මෙහෙය වූ ආරක්ෂක ස්ථානයට ගොස් සියල්ල සිදුවන ආකාරය සන්සුන් අන්දමින් බලා සිටියෙමු. තරමක වෙහෙසක් ඒ වන විටත් අපට දැනෙන්නට වූයෙන් මේ මොහොත විවේක ගැනීමට ඉතා ම සුදුසු වූ බව කිව යුතු නැත.

'මොන දෙයක් කරන්න වුණත් විශ්වාසයක් තියෙන්න ඕනෑ: එහෙම වුණොත් පරදින්නෙ නෑ.'

'මේ ඇළෙන් යන්න නම් දණ ඉහ තෙක් වතුරෙ බහින්න ඕනෑ. ඒ ගැන නම් ප්‍රශ්නයක් නෑ.'

පාලිත කී වචන ගැන මා වැඩි සැලකිල්ලක් නොදැක්වූයේ ඒ වන විට මගේ අවධානය ගුහාවේ වහල කෙරෙහි යොමු වී තිබීම නිසා ය.

'හැම ද ම වුණත් මෙතනට වෙලා ඉන්න මං ආසයි.'

'කන්න බොන්න තියෙනව නම් මාත් කැමතියි' පාලිත කී ය.

අප ගෙනැවිත් තිබූ ආහාර පාන එළියට ගතිමු. ඒ සියල්ල අවසන් වූයේ මොන තරම් ඉක්මනින් ද?

අප ගෙනැවිත් තිබූ ඉටි පන්දමත් ඒ වන විට දැල්වී අවසන් වී ගියේ ය.

'ජයා, එන පොට හොඳවෙන්නෙ නෑ. ඉක්මනින් ආපහු යමු. නැත්නම් අපිට කට්ට කළුවරේ ඉන්න වේවි.'

'එළියක් නැති ව ගුහාවෙන් පිටවෙන එක ලේසි නෑ.'

පාලිත කලබල විය. ඉතිරි ඉටි පන්දම් කැබලි සියල්ල

[redacted]

Scanned by CamScanner

Scanned by CamScanner

ඔහු ගේ පෙනුම අතිශයින් දුක්මුසුය. ළඟ ම නැයෙකු මරණයට පත් විටක වැලපෙන්නකු මෙන් ඔහු වරින් වර ඉකි ගසමින් හඬයි. තවත් දුරට ඔහු ගේ ඇඬුම බලා සිටින්නට නොහැකි වූයෙන් මම අනෙක් පැත්ත බලා ගතිමි.

'අඬන්න එපා. ඔක්කොම සිද්ධ වෙන්නේ යහපතට කියල කියනව නෙ? සමහර විට වැඩිය යහපතක් වෙන්න බැරි ද?'

පාලිත ඔහු සනසන්නට උත්සාහ කරයි.

'යහපතක් වෙන්නෙ? ගිං ගඟ කියන්නෙ අපේ ජීවිතය. අපි ජීවිතේට වගේ ම ගඟට ආදරෙයි. අවුරුද්දට දෙතුන් පාරක් ගඟ ගලනව. සමහර වෙලාවට අපේ දේපොලත් ගහගෙන යනවා. ඒත් අපි ගඟට බනින්නෙ නෑ. ආයෙත් අපට දේපොල ලබා දෙන්නෙ ගඟ.'

පාලිත සන්සුන් ලෙස ඔහුට ඇහුම්කන් දෙයි. ඔහු කියන දේ මොන තරම් අර්ථවත් ද?

'ගං වතුර බැස්සට පස්සෙ අපේ පොළොව සරුයි. මෝල් ගහක් හිටෙව්වත් සරුවට වැවිල පල දරනව. වතුරෙන් පාඩු වුණා නම් ඒකට සිය ගුණයකින් වන්දි ගෙවනවා. ඒ තමයි ගිං ගඟේ සිරිත.'

ගැමියා ගිං ගඟ තම ජීවිතයට සමාන කළේ මොන තරම් ඉහළ තක්සේරුවකින්ද? ඔහු වැළපෙන්නේ අපට අසා සිටින්නට නොහැකි තරම් ශෝකයකිනි.

'ගඟ ආයෙත් ගලන්නෙ නැද්ද?'

Scanned by CamScanner

'මං හිතන්නෙ නෑ.'

'කොහොම ද ඒ පැත්තට ගලන්නෙ? කවුද ඒක කළේ?'

'මං දන්නෙ නෑ.'

අපි ඔහුගෙන් ඉවත්ව ගඟ ගැලූ මහට ගියෙමු. ඇත්ත, ඉතිරි වී ඇත්තේ: වැලි පමණ ය. දිය සීරාවක් වත් නැත. ගඟක් ගැලූ ලකුණක් පවා නැති තරමට පොළොව වියළී ඇත්තේ තද හිරු එළිය නිසා ය.

මොහොතකින් මට සියල්ල සිහිපත් කළ හැකි විය. පාලිත බියපත් අන්දමින් මගේ මුහුණ බැලී ය. ඔහු ද් සියල්ල තේරුම් ගෙන ඇත. ගඟෙහි ගමන් මාර්ගය වෙනස් කරන ලද්දේ අප විසිනි. එතන දී කුඩා දිය පහරක් වශයෙන් අපට එසේ කළ හැකි වුව ද එයින් ඇතිවන ප්‍රතිඵල ගැන කල්පනා නො කළෙමු.

Scanned by CamScanner

2

පාලිතත් මාත් දෙදෙනාම ගහ අසලට ගියෙමු. අප හිතිඳුම් හරහා දෙනියාය බලා යද්දී ලස්සනට ගැලූ ගඟ දැන් නැත. ගඟෙහි දිය කෙළිමින් සිටි පුරතල් මාළු මැරී ගොස් ය; සමහරු පණ අදිති.

කළ හා වෙනත් භාජන ද අතින් හිසින් ගත් ගැහැණුන් හා පිරිමින් ද ඇත ළිං සොයා යන සැටි මම දුටුවෙමි.

'ආ-මේ බාල්දි අරගෙන යන්නේ කොහෙද?'

'වතුර ගන්නට, එගොඩහ ගොඩට යනවා' ඔහු කී ය.

'අනේ අපේ දුකට සැපට දෙකට ම පිහිට වුණු ගඟ හිඳිල ගිහිල්ලා රෙදි හෝදන්නත්, නාන්නත්, බීමට වතුර ගන්නත් හැතැප්මයක් විතර ඈත යන්න වෙලා. මේක කොච්චර කාලයක් කරන්නද මන්ද!'

මගේ සිතේ ඇති වුණේ ලොකු කණගාටුවකි. අපේ අතිපණ්ඩිතකම නිසා, මේ අහිංසක මිනිස්සු ලොකු කරදරයක වැටී සිටිනවා දකීම මොන තරම් වේදනාකාරී ද?

'අපි ඉක්මනට ගිහිල්ලා වතුර පාර තිබුණ විධියට ම හරවමු.'

Scanned by CamScanner

'ඔව් ජයේ, අපි එහෙම කරමු. මම මේ තමුසෙට කියන්න හැදුවෙත් ඒකයි.'

අපිට පැය කිහිපයකින් සියල්ල තිබූ විදියට ම සකස් කරන්නට පුළුවන. ආයෙත් ගඟ පුරුදු විධියට ම ගලා ගෙන යනු ඇත.

'ජයා තමුසෙ හරිම බය ගුල්ලා. දැනටමත් තමුසෙ බය වෙලා නේ ද?'

'නෑ මම බය නෑ පාලිත. මම මොකට ද බය වෙන්නෙ?'

'තමුසෙගෙ මූණ ඇත්ත කියනවා. කොච්චර බය වෙලා ද කියල මූණෙන් බලා ගන්න පුළුවන්.'

'අහිංසක මිනිස්සු කරදරයක දලා, කිසිම හයක් හසරක් නො දන්නා මාළු මරා දලා, දුප්පත් අයට හැම දේටම ප්‍රයෝජන වෙන වතුර ටික නැති කරල ඒකෙන් ද අපි විනෝද වෙන්නෙ? අපේ විනෝදය ඒක ද? මම කල්පනා කළේ ඒ ටිකයි.'

පාලිතගේ මුහුණ අඳුරෙන් වැසී ගියේ ය. ඔහු ගේ මුහුණෙහි වූ විනෝදකාමී පෙනුම අතුරුදහන් විය.

'මේ වෙච්චදේ ගමේ මිනිසුන්ට කියමු. ඊට පස්සෙ වැරැද්ද හරි ගස්සන්ට පුළුවන්' මම කීවෙමි.

'ගම්මුන්ට කියන්න? ඒක මගෙන් නම් කෙරෙන්නෙ නෑ.'

පාලිත ස්ථිර ලෙස ම කී ය.

'අපි වැරැද්ද හරි ගස්සමු. ඒත් මේක රහසක් වගයෙන් තියාගන්න ඕනෑ. කිසිම කෙනෙකුට මේ ගැන කියන්න එපා. සමහර විට ඒ ගොල්ලන් හිතාවි පස් කණ්ඩියක් කඩාගෙන වැටිල මෙහෙම වෙන්න ඇති යි කියල.'

පාලිත තව තවත් කාරණය පැහැදිලි කළේ ය. එහෙත් මගේ සිත මට දෙස් කියන්නට විය. කිසිවකුට කිසිම අන්දමේ කරදරයක් දැන දැන නොකිරීම මගේ සිරිත ය. එසේ තිබිය දී මගේ අතින් මේ සිදු වූයේ අනුන්ට ලොකු කරදරයක් නොවේ ද? එහෙත් පාලිත හද පත්ලෙන් පැන නැඟුණු සන්තෝෂය පිට කරන්නට මෙන් ලස්සනට සිහින් හඬින් ගීයක් ගායනා කරන්නට විය. ඔහුගේ හිසත්, අතුත්, ඇසුත් ගීයෙහි රස විඳිමින් නළියන්නට පටන් ගති.

අපි ආයෙත් ගුහාවට ඇතුළු වූයෙමු. ගුහාව ඇතුළෙහි වූ ඉටි පන්දම් පත්තුකොට උදැල්ල ගෙන ආරක්ෂක ස්ථානයට යන්නට අපට ගත වූයේ ඉතා ම සුළු කාලයකි. පාලිත ගේ අත් යන්ත්‍රයක දැති රෝද මෙන් වේගයෙන් ක්‍රියා කරන්නට පටන් ගති. ලොකු ගල් කිහිපයක් පෙරළා දමා දිය පහර අනෙක් පැත්තට හරවා එයින් පසු ගුහාවේ එක් පැත්තක වූ පස් අනෙක් පැත්තට ගොඩ ගැසුවෙමු. වතුර පාර කලින් ගැලුවාක් මෙන් සිහින් සෙරෙන් ගලා බසින්නට විය.

'අන්න ආයෙත් වතුර ඉස්සර ගැලූ විධියට ගලනවා. දැන් ඉතින් අපි යමු.'

අපි ගුහාව ඇතුළෙහි වැඩි වේලාවක් රැඳී නො සිටියෙමු. ගමේ මිනිසුන් ක්‍රියා කරන ආකාරය බැලීමට අප තුළ තිබුණේ




Scanned by CamScanner

ලොකු ආසාවකි. ඒ නිසා අපි හැකි තරම් ඉක්මනින් ගැමියා... අතරට ගියෙමු. වැඩි වේලාවක් ගත වෙන්නට ... සන්තෝෂයෙන් පිරී ඉතිරී කෑ කෝ ගහන මිනිසුන්ගේ හ... ඇසෙන්නට විය. හැම පැත්තෙන්ම ප්‍රීති ඝෝෂා ය.

අපි කිසින් නොදත් අහිංසක ළමයින් දෙන්නකු මෙ... තැනින් තැන රැස් වී කතාබහ කරමින් සිටි ගම්මුන්ගෙ... කතාබහට කන් දී බලා සිටියෙමු.

'මේ මහා පුදුම වැඩක්.'

හිනිදුම පාලම අසල රැස් ව සිටි මිනිසුන් අතර... ගම්මුලාදෑනියාත්, දේවගැතියාත් වූ බව පෙනිණ.

'දේව කෝපයක් වෙන්නත් පුළුවන්.'

ඒ කීවේ වයසක ගැමියෙකි.

'කොහොම වුණත් දැන් ඉතින් කරදර වෙන්න දුක් වෙන්න දෙයක් නැහැ නෙ? තම තමන්ගෙ කටයුතු හොඳින් කර ගන්නයි තියෙන්නෙ.'

පූජක තැන කීය.

එයින් පසු දවස් දෙකක් ම නිශ්චල ව ගත වී ගියේ ය. ගිං ගඟ දිගේ උඩුගමින් උතුරු පැත්තට ගියා මිසක උඩුගමින් පහලට යන්නට එයින් පෙර මට අවස්ථාවක් ලැබුණේ නැත. පාලිතත් මාත් මේ ගමන ගැන නැන්දට කියා ඇගෙන් අවසර ගතිමු.

ගිං ගඟේ සුන්දරත්වය, ලස්සණ දක්ක හැක්කේ නාගොඩ, හම්මැලිය, බද්දේගම ආදී ප්‍රදේශ හරහා ගඟ ගලන විට ය.

Scanned by CamScanner

අපි බද්දේගම තෙක් පැමිණියෙමු.

ගඟ දෙපැත්තේ ලස්සණට වැවී තිබුණ උණ පඳුරු තාලයට සින්දු කියන්නාක් මෙන් සුළං පහරට සෙලවෙමින් තිබිණ. ගඟ අසබඩ හැම තැන ම පාහේ උක් වගාව සරු විය.

'අන්න ආයෙත් ගඟ වියළී ගිහිල්ලා. අනේ දෙයියනේ අපේ ගඟ දැන් ගලන්නේ නැහැල්ලු.'

මේ කටහඬින් අපි දෙදෙන ගල් ගැසී බලා සිටියෙමු. ඇත්ත, ගමේ වයසක මිනිසකු වැළපෙන අන්දම අපට පෙනේ.

'අම්මම මුතුන් කාලෙක වෙච්ච දෙයක් යැ මේ? ඇයි දෙයියනේ අපි දැන් ජීවත් වෙන්නෙ කොහොමද? මේක නම් දේව ශාපයක්.'

ගැමියා තව දුරටත් කියවන්නට විය. ඔහු අසලට තවත් ගැමි ගැහැණු ද, පිරිමි ද දහ දොළොස් දෙනෙක් ම එක් වූහ.

අපි ගඟ අසලට ගොස් බැලීමු. කාරණය ඇත්ත. ගඟ වියැළී ගිහින්, නිශ්චලව ගැලූ ගඟ වෙනුවට දැන් ඇත්තේ සිහින් වැලි ගොඩවල් පමණයි.

අපි දැන් ගමන් විඩාවෙන් හෙම්බත් ව සිටියෙමු. වේලාව දහවල් එකොළහමාරට පමණ ඇත. කලින් ගඟ ගැලූ මඟෙහි ඇති සිහින් සුදු වැලි ගොඩක් මත අපි හිඳ ගතිමු. දෙපැත්තේ වූ ගස්වලින් හෙවණ වූ මේ ස්ථානය අපට රජ සැප ගෙන දෙන්නට සමත් විය.

'අද උදේ දහයේ ඉඳල ගඟ වේලිලා. ආයෙත් ගඟ

Scanned by CamScanner

ගලයි කියල හිතෙන්වත් හිතන්න බෑ. සමහර මිනිස්
දැනටමත් පිස්සු වැටිලා. රෙදි නැත්ද මර ලතෝර
දෙනවා. මේක නම් හරිම විපත්ති කාලයක්. ඇ
දෙයියනේ අපිට හරියට බොන්න වත් වතුර නැතෙ

අප අසලට පැමිණි වයස්ගත ගැමියෙක් දුක් මුසු හඬි
කී ය.

'ඇත්තයි ජයේ, මේ හරියේ ළිං නෑ. මිනිස්සු බොන්නෙ
නාන්නෙත්, අනෙක් හැම වැඩකට ම ගන්නෙත් ගලෙ
වතුර.'

'දැන් අපි මොකද කරන්නෙ?'

'මං කල්පනා කරන්නෙත් ඒකයි.'

පාලිත බර කල්පනාවක වැටී ඇත. ඔහුගේ මුහුණෙහි
පැතිර ඇත්තේ ගැඹුරු පෙනුමකි. අතරින් පතර හෝ එහි
සිනහවක් දකින්නට නැත. අහසත් පොළවත් එකට ගැටලන්නට
ඔහු උත්සාහ කරතැයි මට සිතින.

'මේක වුණේ කොහොමද කියල මම දන්නව'
නිශ්ශබ්දතාවය බිඳිමින් පාලිත කතා කළේ ය.

'එදා අපි ඇළේ වතුර පාර හරවද්දී කලින් තිබූ පස්
කණ්ඩිය හොඳට ශක්තිමත්ව තිබුණා. ඒ වුණාට අපි
හදපු පස් කණ්ඩිය ශක්තිමත් නෑ. ඒ නිසා වතුර
ඔරොත්තු දෙන්නෙ නැතුව හේදෙන්න ඇති.'

'එහෙනම් පාලිත අපි ආයෙත් ගිහිල්ලා ඒක හදමු.'

'බෑ බෑ අපි අපේ විනෝදය නැති කර ගන්නෙ

Scanned by CamScanner

මොකටද? දවසක් දෙකක් වතුර නැතිව මේ ගොල්ලන් කරදර වුණා වෙ. ඕක ඔය තරම් අමාරු දෙයක් නොවෙයි නෙ? අතික් එක මිනිස්සු පුරුදු වෙන්න ඕනෑ කොයි ජීවිතයටත්. ගහ නැතැයි කියල අඬා වැලපීම පිස්සුවක්.'

'එහෙම නෙවි අපිට මේක සෙල්ලමක් වුනාට අතික් මිනිසුන්ට ඒක සෙල්ලමක් වෙන්නට දෙන එක හරිද?'

'ඕවායෙ හරි වැරදි කතා කරන්න වෙලාවක් නොවෙයි මේ. අපි ඉක්මනට ගෙදර යමු.'

එද අපට ගෙදර දී දැන ගන්නට ලැබුණ අලුත් ම ආරංචියෙන් පුදුමයට පත් වීමු. අපේ සාහසික ක්‍රියාව නිසා හිතිදුම් පත්තුවේ හා ගහබඩ පත්තුවේ ද මිනිසුන් කඳුළු හෙළන අතර වලස්මුල්ල, රන්න, අම්බලන්තොට පළාත්වල මිනිසුන් ජය පැන් බොන්නට පටන් ගෙන තිබෙන බවය. ඒ හම්බන්තොට සිට පැමිණි මිත්‍රයෙකු හා මාමා අතර පැවති කතා බහට අපි දෙදෙන කන් දුනිමු.

'මොනවද ඒ පළාතේ අලුත් ආරංචි හේම?'

'ආරංචි නම් අප්‍රමාණයි.'

'ඒකත් ඇත්ත. තමුසෙගෙ රස්සාව රට පුරා ඇවිදින එක නිසා ආරංචිවල හිඟයක් තියෙන්න බැ නෙ?'

ඔවුහු දෙදෙනම හඬ නහා සිනාසෙන්නට වූ හ.

'රන්න, වලස්මුල්ල, අම්බලන්තොට පළාත් ඉස්සරහට හොඳට දියුණු වේවි.'

'ඒ කොහොම ද?'

Scanned by CamScanner

'පාලිත හිතන්නෙ මේක පුංචි සෙල්ලමක් කියලයි?'

'අයියෝ මේක හරිම සිම්පල්!'

'මිනිස්සු දස් ගණනකට අඩන්න සිද්ධකරන එ සිම්පල් වැඩක්?'

මම මගේ අදහස් ඔහුට විස්තර කෙළෙමි.

'ජයා, වතුර අවශ්‍ය හිනිදුම් පත්තුවට වත් ගඟබ පත්තුවට වත් නෙවි, ඈත රුහුණේ මිනිස්සුන්ට තේරුණා ද?'

'පාලිත මට තමුසෙගෙ කතාව තේරුම් ගන්න බෑ.'

'ඈත රුහුණේ ඉන්නෙ ඉතාමත් උත්සාහවන්ත මිනිස්සු වතුර නැති ව ඒ ගොල්ල කොච්චර දුක් විඳිනව ද? එහෙම වෙලත් ඈත රුහුණෙ හැම කුඹුරක් ම පුළ් පුළුවන් හැටියට අස්වද්දල තියෙනවා. ඔයාට මතක ද ගාල්ලෙ ඉඳල එනකොට පෝද්දල හරියෙ හැමදාම වතුරට යටවෙන හරියක් තියෙනවා?'

'ඔව්, ඔය කියන්නෙ හෝලුවාගොඩ!'

'අන්න හරි හැතැප්ම තුන හතරකටත් වැඩිය කුඹුරු, නිකම්ම පාළු වෙලා! මේ ගඟ ඈත රුහුණට දුන්නොත් ඒ ගොල්ලන් නියම ප්‍රයෝජන ගනීවි.'

'ඒක අපට අයිති වැඩක් නෙවි.'

මම කීවෙමි.

'අපිට ඒක කරන්න

පාලිත පිළිතුරු දුන්නේය.

'නෑ නෑ මේ ගහ අයිති හිනිදුම් පත්තුවෙයි ගහබඩ පත්තුවෙයි මිනිසුන්ටයි.'

මම වහාම පිළිතුරු සැපයුවෙමි.

ඔහු ගේ අදහස් නිවැරදි වුව ද එක් ගැමි පිරිසක් සතුව තිබූ දිය පහර අන් අතකට හරවා වෙනත් පිරිසකට අයත් කොට දීම අසාධාරණ බව මම වැඩි දුරටත් පෙන්වා දුනිමි.

අප දෙදෙනා අතර පැවැති වචන හුවමාරුවෙන් පසු ඔහු මගේ අදහස් පිළිගත්තේ ය.

එද හවස් වරුවේ එක විනාඩියක් නැර පාලිත ලා ගේ ළිඳට වතුර ගෙන යන්නට ගමේ ගැහැනුත් මිනිස්සුත් ඇදී ආහ. රාත්‍රියේ දහය දෙළහ වනතුරු ම නො කඩවාම වතුර ගෙන ගියහ. බෙහෙවින් ග්‍රීෂ්මය සහිත දිනයක් වූ හෙයින් අපි ජනෙල් හැර නිදු ගතිමු. රාත්‍රියේ ද එහි ආ ගිය මිනිසුන්ගේ කටහඬ ඇසෙන්නට විය.

ළිඳට ආ ගිය මිනිසුන් කළ කතා බහ නිසා අප ලැබූ විනෝදය විශාල ය. එක් මිනිසෙකු අතිත් අය සමහ කීවේ මේ දේව කෝපයක් බව ය. තවත් අයෙක් ඒ අදහසට විරුද්ධ විය.

'මේක මන්තර කාරයෙකුගෙ වැඩක්. හරිම දක් මන්තරකාරයො ඉන්නව මාතර පැත්තෙ. මම දැ හිතේ තියාගෙන ඉන්නව හෙට අනිද්දට මාතර ගිහි

එයින් මන්තරකාරයෙක් එක්කර ගෙන එන්නට:

'ගහක් හරවන්නට පුළුවන් තරමේ මන්තරකාරයෙ එහෙ ඉන්නවද?'

'ලේන්සුවට මතුරල ලේන්සුව උඩ නැගල ගිං ගඟේ ප(ැත්තෙ) ඉඳල මේ පැත්තට ගිය මන්තරකාරයෙ ඉස්සර ඉඳල තියෙනවා.'

මේ කිවේ හන්දියේ එළවුළු කඩයේ අයිතිකරු ය.

'මාත් අහල තියෙනවා ඉස්සර මාතර පැත්තෙ මන්තරවලට ප්‍රසිද්ධ ආරච්චි කෙනෙක් ගැන. එයාලෙ ගෙදරට දවසක් ආවලු ඉන්දියාවෙ ඉඳල ප්‍රසිද්ධ මන්තරකාරයෙක්. දෙන්නම හුහක් වෙලා මන්තර ගැන කතා කර කර හිටියලු. ටිකකට පස්සෙ අමුත්තට බොන්නට තැඹිලි ගෙඩියක් දුන්නලු. ආරච්චි එක තැඹිලි ගෙඩියක් අතට ගත්තලු. ඉන්දියන් මන්තරකාරයා එයාගෙ තැඹිලි ගෙඩිය ආරච්චි අතට දුන්නලු. ආරච්චි එය අතට ගත්තම තැඹිලි ගෙඩිය ඇතුලෙ මීයොලු. ආරච්චි කළේ මොකද දන්නව ද? ඒකට මතුරල ඉන්දියන්කාරයට දුන්නලු. තැඹිලි ගෙඩිය ඇතුළෙ දැන් බළලෙකුත් ඉන්නවලු. කොහොම ද වැඩේ?'

'ඉන්දියන් කාරය මැතුරුවාම තැඹිලි ගෙඩිය ඇතුලෙ මීයො. ආරච්චි මැතුරුවාම බළලෙක්. ලස්සනයි නේද?'

කටහැකර ජේම්ස් අයියා මහ හඬින් සිනාසෙන්නට පටන් ගත්තේ ය.

'එහෙනම් මේක මන්තරකාරයන් ගේ වැඩක් !'

'ඔව්, ඒකෙ සැකයක් නෑ.'

එළවුළු කඩේ මුදලාලි කීය.

'ජයා, දැන් තමයි හොඳ පැත්ත ඇවිල්ල තියෙන්නෙ, මේකෙන් වුණේ යහපතක්. අපිට මේකෙන් තව තවත් විනෝද වන්නට පුළුවන්.'

'ඒ කොහොමද?'

'ජයා, මේක රහසක් වශයෙන් තියාගන්නට තමුසෙ පෙරොන්දු වෙන්න ඕනෑ. එහෙම නැතුව මිනිස්සු දැන ගත්තොත් අපි මේකට සම්බන්ධ යැයි කියල ලොකු කරදරයක් වෙන්න පුළුවන්.'

'මේ රහස එළි කරන්නෙ නෑ කියල මුලින් ම අපි දෙන්න පොරොන්දු වුණා. ආයෙත් පොරොන්දු වෙන්න මම කැමති නෑ. මම වචනයක් කිව්වොත් ස්ථිරයි. වචනයක් කිව්වොත් ඒක ආයෙත් වෙනස් කරන්නෙ නෑ.'

'සමාවෙන්න ජයා, මට වැරදුණා.'

පාලිත ඔහු ගේ ඇඳෙන් නැඟිට විත් මගේ ඇඳෙහි පැත්තකින් වාඩි විය.

'ජයා දැන් අපට තව හවුල්කාරයෙක් ඕනෑ. තමුසෙට මතක ද ගුණදාස?'

'ඔව් මට මතකයි.'

'මට එයාව විශ්වාසයි. අපි එයාවත් මේකට හවුල්

කර ගනිමු.'

'මොකක් ද අපි කරන්නේ?'

'මෙන්න මේකයි කරන්නෙ. ගුණදාසවත් පොරොන්දු කරගන්න ඕනෑ මේක රහසක් වශයෙන් තියා ගන්න කියල. උදේට එයාට බාර දීල අන්න අහවල් වෙලාවට ගහ කතරගම පැත්තට හරවන්න කියනවා.'

'ඉතින්?'

'අපි ඒ පැත්තට ගිහින් ඒ මිනිසුන්ට කියමු අපි මන්තරකාරයො කියල.'

'ඉතින්?'

'අද දවල් 1 ට ගහ උඩුගම පැත්තට හරවනව කියනවා.'

'ඉතින්?'

'ඒ ගොල්ලො ඒක විශ්වාස නො කර ඉන්න පුළුවන්, ඒත් ඒ වෙලාවට පස්සෙ ගහ ගලන්නෙ නැතුව ගියාම අපේ කතාව විශ්වාස කරාවි.'

'ඊට පස්සෙ මොක ද කරන්නෙ?'

'ඒ පැත්තෙ මිනිස්සු අපිට වඳින්න පුදන්න පටන් ගනීවි. අපේ හපන්කම් පෙන්වන්න දවසකට දෙතුන් පාර වුනත් ගහ නතර කරන්න පුළුවන්. අපි එහෙම කියන්නේ ගුණදාසට හරියට තියම වේලාවල් කියල

දුන්නට පස්සෙයි.'

'එහෙනම් අපිට පොඩි අඩුවක් තියෙනව.'

'මොකක් ද?'

'අපි තොප්පි දෙකක් ද ගනිමු. හැරමිටි දෙකකුත් ඕනෑ. බොරු රැවුල් දෙකකුත් ඕනෑ.'

'අන්න හරි!'

පාලිත අත්පොළසන් ගහන්නට පටන් ගත්තේ ය.

පසු දින උදයෙහි ම අප කළේ හැරමිටි දෙකක් හා බොරු රැවුල් දෙකක් ද සොයා ගැනීම ය.

රැවුල් හා හැරමිටි පිළියෙල කර ගැනීමෙන් පසු ගුණදාස මුණ ගැසී අපේ වැඩ පිළිවෙල ඔහුට විස්තර කර දුනිමු. ඔහු එක පයින් ම අපේ යෝජනාවට එකඟ විය. ජල ප්‍රවාහය පිළිබඳ සියලු රහස් ඔහුට විස්තර කර දුනිමු.

දහවල් එකොළහට කලින් ඔහු සමඟ ගුහාවට ඇතුළු වී ඔහුට කටයුත්ත පවරන්නට අපට හැකි විය. ගුණදාසට ඔරලෝසුවක් නො වූයෙන් පාලිත ඔහු ගේ අත් ඔරලෝසුව ගලවා ගුණදාස අතට දුන්නේය. එහෙයින් නියමිත වේලාවට ගඟ හරවන්නටත් හරස් කරන්නටත් ඔහුට අපහසු නො වී ය.

කතරගම පැත්තට යනු පිණිස තවත් කන්දක් හරහා දකුණට ගමන් කළ යුතුව තිබිණ. කන්ද මුදුනේ දී අපි මන්ත්‍රකාරයන් මෙන් වෙස්වළා ගතිමු.

මුලින් ම අපට දක්නට ලැබුණේ කුඩා ගම්මානයකි. එහි ගෙවල් තිබුණේ ද ස්වල්පයකි. පැහිරි බෙහෙවින් වවා තිබුණු අතරින් පතර තේ වතු ද විය. පොල් ගස් නො වී ය. ළමයි කිහිප දෙනෙක් සෙල්ලම් කරමින් සිටියහ.

දන් එකොළහ පහු වී ඇත. අප කලින් නියම කර ගත් අදහස ක්‍රියාත්මක කරන්නට දැන් වේලාව පැමිණ තිබේ. පාලිත නියම මන්ත්‍ර කාරයකුගේ චරිතය නිරූපණය කළේ ය.

'හා! කොහොම ද ළමයිනේ? නිකම් සෙල්ලම් කළාට මදියි. ලෝකය ගැනත් හොයන්නට ඕනෑ. ලෝකයේ හැම තැනම අවුල්, යුද්ධ, වසංගත, ආහාර හිඟය ආදිය කිසිම රටකට අඩු නෑ. ඇයි ඒවා ගැන හිතන්නෙ නැත්තෙ?'

මට පාලිත ගැන පුදුම සිතෙන්නට විය. ඔහුගේ කථාව ගාම්භීර ය. කෙනෙකුගේ සිත් ඇදෙන සුලුය. නොනැවතී ඔහු දිගටම කථා කරයි.

කොල්ලන් අප ගැන ඒ තරම් සැලකිල්ලක් යොමු කළ බවක් නො පෙණින.

'ඔය ළමයි අපටත් අඹ ගෙඩි දෙක තුනක් දුන්නොත් හොඳයි නේ ද?'

පාලිත ගේ මේ කථාවෙන් පසු ඔවුන් තුළ ඇති වූයේ සැකයක් වැනි හැඟීමකි.

'තමුසෙලා කවුද?'

කටකාර කොලුවෙක් ඇසී ය.

'හා..... හා..... හා..... හා! අපි......?

කොල්ලෝ කිහිප දෙනා පුදුමයෙන් බලන්නට වූ හ.

'අපි ව අඳුනන්නේ නෑ, ඇත්ත ද? අපි මන්තරකාරයෝ.'

සැකක් බියක් නැති ව පාලිත ගැඹුරු හඬින් කීය.

'මේ ගඟ මේ පැත්තට හැරවූයේ අපි. ඇයි අප ගැන මෙයට කලින් අහල නැද්ද? මගේ නම රාමස්වාමි. මේ මගේ යාළුවා භාරතස්වාමි.'

'අපි මෝඩයො කියල හිතුවද ඔය බොරු කයිවාරු විශ්වාස කරන්න?'

'හොඳයි ඒකට කමක් නෑ. අපි මන්තරකාරයො ද නැද්ද කියල පස්සේ පෙන්නන්න පුළුවන්. දැනට අපිට අඹ ගෙඩි දෙක තුනක් දුන්නම ඇති.'

'මන්තර කාරයො කියල ඔප්පු කරන තුරු අඹ ලෙල්ලක් වත් දෙන්න බෑ'

කටකාර කොලුවා කීය.

'ඔව්, අපිට පුළුවන් අපි මන්තරකාරයො කියල ඔප්පු කරන්නට.'

පාලිත බිය සැක නැතිව කී ය.

'මේ පළාතෙ මිනිස්සු කෙළෙහි ගුණ නැති මිනිස්සු. ඒ නිසා ගඟේ වතුර හරියට දවල් දෙළහට නතර කරන්න මට සිද්ධ වෙනව.'

පාලිත හැරමිටිය අහස දෙසට දිගු කොට කීවේ ය.

'හා, පුළුවන්නම් වතුර නතර කරන්න' එහි සිටි එකෙක් අභියෝගය පිළිගත්තේය.

'හොඳයි දවල් දෙළහට වතුර නතර වේවි!' පාලිත ශබ්ද නඟා කීය.

'මෙහෙම එන්න භාරතස්වාමී.'

අනික් පිරිස ඉදිරිපිට ම මා කැඳවී ය. අපි දෙදෙන ගඟ අයිනට ගියෙමු. සිනා උපදවන වචන මාලාවක් පාලිත ගේ මුවින් නිකුත් විය. අපි හැරමිටියෙන් එකසිය අටවර බැගින් වතුරට පහර දුනිමු.

'මොන්ව කළත් ගඟ නම් ගලනව.'

රැස්ව සිටි පිරිස අපට සමච්චල් කරන්නට වූ හ.

'අපි බලමු මොක ද වෙන්නෙ කියල. දවල් දෙළහට බලාගන්නට පුළුවන් කවුද හරි කියල.'

පාලිත ගැඹුරු හඬින් පිළිතුරු දෙයි.

'වැරදිලාවත් ගුණදසට ගඟ හරවන්නට බැරි වුනොත්? නියම වේලාවට පස් ඇදගන්නට නුපුළුවන් වුනොත් අපි ඉවරයි. මුන් අපට තලාවි; විහිළු කරාවි.'

මගේ හදවත ගැහෙන්නට පටන් ගත්තේ ය. එහෙත් පාලිත සියල්ල විශ්වාස කරමින් ගරු ගාම්භීර පෙනුමක් මුහුණට ආරූඪ කර ගෙන බස්තම වනමින් සිටියේ ය. අප

Scanned by CamScanner

කෙරේ එද පුදුම අන්දමේ ආත්ම විශ්වාසයක් තිබීම ගැන මට අද වුවද පුදුම නොවී නො සිටිය හැකි ය.

ගත වුණේ මොහොතකි. වෙනත් විධියකට කියනවා නම් මිනිත්තු දහයක් ගත නොවූ තරම් ය. ගඟේ ජල වේගය ක්‍රමයෙන් පහළ බසින්නට විය. කාගේත් ඇස් යොමු වී තිබුණේ ගඟ දෙසට ය. ගුණදාස භාරගත් වගකීම හරිහැටි ඉෂ්ට කිරීම ගැන මම දෙවියන්ට පින් දුන්නෙමි. එහෙම නොවුවා නම් අපට මුහුණ දෙන්නට සිද්ධ වන්නේ ලොකු ලැජ්ජාවකට ය.

කොහේදෝ ගෙදරක ඔරලෝසුවේ දෙළහ වදිනවා ඇසිණි.

ටාං ටාං ටාං ටාං ටාං ටාං ටාං
ටාං ටාං ටාං ටාං ටාං

මම හරියට ම ගණන් කළෙමි. ගණන හරි, දෙළහයි. ඒ වන විට ගඟේ වතුර හිඳී හමාර ය.

මිනිසුන් අපේ මුහුණ දෙස බලන්නට වූයේ බිය මුසු අන්දමටය. සමහර අය හෙමින් හෙමින් පස්සට යන සැටි ද මම හොර ඇහින් බලා ගතිමි.

'කෙලෙහි ගුණ නැති මිනිසුන්ට ඒකට දඬුවම් කරන්න ඕනෑ.'

පාලිත කතා කරන්නට විය. මිනිස් පොදිය දෙස පාලිත බැලුවෙ කෝප දීප්ත නේත්‍රවලිනි.

'කෙළෙහි ගුණ නැති මිනිසුන්ටත් ගමටත් දඬුවම් කරන්නට කලින් කියන්න, අඹ මෙහේ තියනව ද? නැද්ද?'

Scanned by CamScanner



"එකයි-දෙකයි-තුනයි-හතරයි-පහයි."

අඹ සියල්ල එතැනට පාත් විය. ගම්මු කිහිප දෙනෙක් පාලිත ළඟ නැමී, ගමේ තිබෙන සියලු ම අඹ විනාඩි දහයක් ඇතුළත එතැනට ගෙනෙන බවට පොරොන්දු වූහ.

අපි ඔවුන්ට කතා කළෙමු. ඉදිරි කාලයේ දී අපට යටහත් වන බවට පොරොන්දු වන්නේ නම් තව විනාඩි කිහිපයකින් ගඟ ගලන්නට සලස්වන බව කීමු.

"ඔව්! අපි පොරොන්දු වෙනවා. අපි පොරොන්දු වෙනවා."

එක හඬින් සියල්ලෝ ම කීහ. විනාඩි දහයක් ගත වන්නටත් පෙර ගඟ ආයෙත් හෙමින් හෙමින් ගලන්නට පටන් ගත්තේ ය. ඒ වන විට පාලිත අර අපූරු වචන මාලාව ශබ්ද නඟා කියමින් හැරමිටියෙන් ගඟ දියට තට්ටු කරමින් සිටියේ ය.

ජලය හෙමින් හෙමින් ගලන්නට පටන් ගෙන වේගවත් වන විට පාලිත මන්තරය ජප කිරීම නතර කළේ ය.

3

අපි අපේ ජයග්‍රහණය ගැන යටි සිතින් උදම් වීමු. පාලිත ගේ මුහුණෙහි සන්තෝෂය වැගිරෙන්නට විය. මේ අවස්ථාවේ පාලිත දන්නා හඳුනන මිනිහෙක් එතැනට පැමිණියේ ය. අවාසනාවකට මෙන් ඔහු පාලිත හඳුනා ගති.

'පාලිත මහත්මයා, ඔබට මේ මොකද වුණේ? මොකක් ද මේ පුදුමය? ඇයි මේ තියහට මහලු වෙලා? මේ දිග රැවුලක් කොයින් ද? ඔබේ මල්ලීත් මෙච්චර මහලු වුණේ කොහොම ද? ඔහේලා මේ පළාතේ මොකද කරන්නේ?'

ඔහු දිගින් දිගට ඇසූ මේ ප්‍රශ්න නිසා අපි දෙදෙන අන්දුන්කුන්දුන් වීමු. එහෙත් වාසනාවකට මෙන් මේ කිසිවක් ඒ පළාතේ මිනිසුන්ට නො ඇසිණි. අනෙක් කෙනෙකුට මේ ඇසෙන්නට පුළුවනැයි බිය වූ පාලිත ඒ නිසා ඔහු කැඳවාගෙන පැත්තකට ගියේය. ඔහු පිටත් කොට හැරීමෙන් පසු පාලිත ආයෙත් මා සිටි තැනට පැමිණ මෙසේ කී ය.

'ජයා අපි මේ දවසට කළ වැඩ හොඳට ම ඇති. කවුරු හරි අපිව අඳුනා ගන්නට කලින් අපි යමු.'

ඔහු ගේ කීමට මම එකඟ වීමි. අප හැකි තරම් ඉක්මනින් ඒ පළාතෙන් පිට වී යා යුතු යැයි අප දෙදෙන ගත් තීරණය

එහා ක්‍රියාත්මක විය. අප දෙදෙනා එන අතර ගඟේ ජලය ගැන පවුල් දෙකක් අතර වූ හබයක් ගැන ද අසන්නට ලැබිණ.

එක් කුඹුරු හිමියකු ගඟේ ජලය ඔහු ගේ විශාල කුඹුරු යාය තෙක් හරවා තිබුණේ කණවැන්දුම් ගැහැණියක ගේ ඉඩමක් හරහා ය. ඒ ගැහැණිය මෙයට විරුද්ධ වූවා ය. කවරදා හෝ තමා ගේ ඉඩම ජලයෙන් යට වී යන්නට පුළුවන් යැයි ඕ මැසිවිලි කියන්නට වූවා ය.

එහෙත් කුඹුරු හිමියා එයට කන් දුන්නේ නැත.

'මේ ගේ අයිති මටයි. මේ ඉඩම ඔහේ ගේ තාත්තා උකසට තිබ්බා. බේරාගත්තේ නෑ. දැන් මේකෙ අයිතිය මටයි. මම මේ අහිංසක මනුස්සයා නේද කියල ඔහේට ඉන්න දුන්නාට ඔහේට මේ ගෙයි හෝ ඉඩමේ කිසිම අයිතියක් නෑ'යි කුඹුරු හිමියා කීය.

'ඒවා කොහොම වුණත් මට මගේ ගෙයි අන්තිම හුස්ම හෙළන්න ඕනෑ. මැරුවත් මම මේ ගෙයින් යන්නේ නෑ. මම උපන්නෙත් මෙතන. මැරෙන්නෙත් මෙතන, මගේ ඇස් පණාපිට මේ ඉඩම වතුරෙන් යට වෙන්න දෙන්න බෑ.'

කනවැන්දුම් ගැහැනිය කුඹුරු හිමියා සමඟ සණ්ඩු කරන්නට වූවා ය.

'කන්ද උඩ තියෙන පුංචි ගෙය ඔහේට දෙන්න පුළුවන්. මැරෙනකං ඒ ගෙයි හිටියට කමක් නෑ. මට මේ ගෙටත් වත්තටත් කැමැති දෙයක් කරන්න පුළුවන්. ඇරත් මගේ මේ කුඹුරු අක්කර සිය ගණනක් එක්ක

සිළුණ කොට මොකක් ද මේ ගේ පැල? යකාට ගියාවේ!'

කණවැන්දුම් ගැහැනියගේ මුවින් පිට වූ සුසුම් වැල මුළු ලෝකය ම දවා අළු කරන්නට සමත් වෙතැයි මට සිතුණේය.

පාලිතත්, මමත්, කුඹුරු හිමියාත් අර ගැහැනියත් අතර වූ රංඩුව මුල සිට අවසන් වන තුරු බලා සිටියෙමු. ඇත්ත වශයෙන් අපට ඇති වූයේ කිව නොහැකි තරම් දුකකි. ඒ අහිංසක ගැහැනිය ජීවත් වූයේ මොන තරම් දුකකින් ද? ඇය රැක ගන්නට දරුවෙක් ද නැත. ඇයට ස්ථිර ආදායම් මාර්ගයක් ද නැත; යන එන තැනක් ද නැත. එවැනි අසරණ ගැහැනියක අයත් ගෙය ගහට යට කර දමන්නට කුඹුරු හිමියා කරන උත්සාහය මොන තරම් අසාධාරණ ද?

'ඒ මිනිහා හරිම දුෂ්ටයෙක්' පාලිත කී ය.

'අපට කරන්නට පුළුවන් දෙයක් අපිත් කරමු'යි මම කීවෙමි.

'උන්දැට වතුර නැතිව ගියාම ඔක්කොම ඉවරයි නේ?'

අප එන තුරු ගුණදාස පෙර මග බලා සිටියේය.

'කොහොම ද වැඩේ?' ඒ ගුණදාස ය.

'වැඩේ නම් මල් පහයි' පාලිත සන්තෝෂයෙන් පිළිතුරු දුන්නේ ය.

'හරියට ඔරලෝසුවේ කටු එකොළහට එන කොට මම වැඩේ පටන් ගත්තෙ. ඒත් පාලිත කියාපු විධියට

මම උඩුගම පැත්තට හැරෙව්වේ නෑ.'

'එහෙනම්?'

'මං තවත් දෙයක් හොයා ගත්තා'

'මොකක් ද ඒ?'

'තවත් අලුත් පාරක්. ඒ පැත්තට තමා ඒ වෙලාවේ වතුර පාර හැරෙව්වේ.'

'බොහොම හොඳයි. අපිට ඒ ගොල්ලොත් එපා. මේ ගොල්ලොත් එපා. දෙපැත්තට ම අපි වතුර දෙන්නෙ නෑ. අලුත් පාර දිගේ වතුර ගියාවේ. උන් දෙගොල්ල ම පාඩම් ඉගෙන ගත්තා වේ.'

පාලිත ඒ කීවේ තරහෙනි.

හිරු බැහැගෙන යන්නට ළං වී තිබිණ. අහසේ අඳුරු වලා සැරිසරන්නට විය. වටින් පිටින් ඇඳිරි වැටෙන්නට පටන් ගති. කුරුල්ලෝ කැදලි කරා ඉගිළ ගිය හ. මුළු දවස ම එක දිගට වැඩෙහි නියුක්ත ව සිටි හෙයින් අපට තදින් මහන්සි දැනෙන්නට විය. එදින වෙනත් කටයුත්තක් කරන්නට ඉඩක් නැත. අපේ වැඩ පිළිවෙළ අංග සම්පූර්ණ අන්දමින් ක්‍රියාවේ යෙදවීමට පසු දින නියම කරගත් පරිදි වේලාවට ගුහාව අසලට එන්නැයි ගුණදාසට ද කියා අපි ආපසු ගියෙමු.

පසුදින පාලිත අවශ්‍ය කිසිවක් ගෙන ඒමට කඩමංඩියට ගියේය. යම්කිසි හෙයකින් ඔහු ප්‍රමාද වුවහොත් මහ දී මුණ ගැසෙන්නට මට පැමිණෙන්නැයි ද කීය.



පාලිත පිටත් ව ගිය පසු මම කාමරයෙහි තනි වීමි. අපට විසඳීමට තිබුණේ උභතෝකෝටික ප්‍රශ්නයකි. මේ ගම් දෙකෙහි ම නපුරු මිනිසුන් සිටින බවට කිසිම සැකයක් නැත. එහෙත් ඔවුන්ට අයත් ගඟෙහි ජලය අහිමි කරවීම නම් කිසිසේත් සාධාරණ නො වේ. කාමරයෙහි ගත කළ පැය කිහිපය මට දවසක් මෙන් විය. පාලිත එන බැව් කී වේලාවට නො පැමිණි නිසා මම ඔහු සොයාගෙන ගියෙමි.

මම උඩුගම කඩමංඩියට ටිකක් එහායින් වූ පාලම අසලට පැමිණියෙමි. පාලමේ එක පැත්තක වූ කනුවක් අසලට වී වඩු බාස් හා තවත් තරුණයෙකු අතර වූ වචන හුවමාරුව මට ඇසිණ.

'ඒ කතාව ඇත්ත නම් මේ පැත්ත කාන්තාරයක් වේවි' එකෙක් කීය.

'වලස්මුල්ල පැත්තෙ මිනිස්සු මහා පුදුම අන්දමේ කතා කියනවා. ඒ ගොල්ලන් කියන කතාවල ඇත්තක් තියෙන්නට පුළුවන්.'

අනෙකා කීය.

'මොනවද ඒ ගොල්ලන් කියන ඔය පුදුම අන්දමේ කතාවල්?'

'අර ළමයි දෙන්නා-කවුද?......... ආ............ ඔව් පාලිත කියන ළමයයි ජයදේව කියන ළමයයි ඉර මුදුන් වේලාවක මන්තරකාරයෝ වගේ වෙස් වළාගෙන වලස්මුල්ල පැත්තට ගිහින් තියෙනවා. ඒ ගොල්ලන් මන්තරකාරයෝ බවත්, ගඟේ වතුර පාර හරවන්නට පුළුවන් බවත්, තව පුදුම දේවල් කරන්නට පුළුවන් බවත් කියල තියනවා.'

Scanned by CamScanner

ගංගේ මිනිස්සු පුළුවන් නම් හරවන්න කීවාලු. ඒකට පස්සෙ මේ ළමයි මොනවද මන්තර වගයක් ජප කරගෙන ජප කරගෙන ගියාලු. විනාඩි දහයක් ගත වෙන්නටත් ඉස්සරින් ගඟේ වතුර හිඳුණාලු.'

'මගේ අදහස මම කියන්නම්. මේ ළමයි දෙන්න ගඟ පටන් ගන්න තැන මොන ක්‍රමයකින් හරි හොයා ගෙන තියෙනවා. ඒ ගොල්ලන් ගඟ වෙන පැත්තකට හරවන්නට පුළුවන් බව කියන්නට ඇත්තෙ එහෙම දැනගත්ත නිසයි. ඇත්ත වශයෙන් ගිං ගඟ අයිති අපට. ඒක වෙන කාටවත් දෙන්න බෑ. දඩබ්බර ළමයි දෙන්නෙක්ගෙ දඩබ්බර වැඩක් නිසා අපේ ගඟ වෙන කාටවත් දෙන්න බෑ. දෙන්න බෑ මයි.'

'කාරණය එහෙම නම් මේක වැරදි ක්‍රියාවක්. මට නම් ඔය ළමයි දෙන්න පෙන්නන්න බෑ. මම කොහොමත් ඔය ළමයි දෙන්නට කැමැති නෑ. ඒ ඇරෙන්නත් ඔය පාලිත කියන ළමය ඉන්නව නේද?

මහ නපුරෙක්. හරිම වසවර්ති මාරයා. ඒ ගොල්ලන් ගඟ පටන් ගන්න තැන දැන ගත්තත් මේ විධියේ වැඩක් කරන්න පුළුවන් කියල මම හිතන්නෙ නෑ. මේ ගඟේ උල්පත් තියෙනවා නේද? ඒ ගොල්ලන් කොහොම ද ඒවා නතර කරන්නෙ?'

වඩු බාස් සියල්ල දත් පණ්ඩිතයකු මෙන් ප්‍රශ්න කළේය. ඔහු ගේ හිසෙහි වූයේ කෙස් ගස් ස්වල්පයකි. ඇත්ත වශයෙන් හිස පුරා වූයේ තට්ටයි. තට්ටයාගේ හිසෙහි පිටිපස කෙස් ටික එකතු කොට බඳින ලද තල ගුළියක් වැනි කොණ්ඩයක් විය.

දෙවැන්නා එනම් තරුණ පහේ තැනැත්තා කතා නොකළේ ය. ඔහුට කතා කරන්නට තරම් දෙයක් නො වූහ යි සිතමි. නො එසේ නම් ඔහු තට්ට බාස් නොරුස්සන්නේ විය යුතු ය.

මම හැකි තරම් ඉක්මනින් ගමන් කරන්නට වීමි. පාලිත හා ගුණදාස ද මුණ ගැසී අප ගැන ගමේ මිනිසුන් කරන කතා බහ ඔවුනට දන්වා සිටීම ය මට වුවමනා කළේ. යම් කිසි බුද්ධිමත් වැඩිහිටියෙකු ගෙන් අවවාදයක් ගන්නා තුරු මේ ක්‍රියා මාර්ගය නතර කරගැනීමට ඔවුන් දෙන්නා පොළඹවා ගන්නට මට වුවමනා කර තිබිණ. මේ නිසා මම හැකි තරම් ඉක්මනින් ඔවුන් සොයා ගියෙමි.

මම ඔවුන් දෙදෙනාට මිනිසුන් අතර පවත්නා අදහස් උදහස් විස්තර කළෙමි.

'මේ මිනිස්සු තාම දැනගෙන නෑ මේ ඔක්කොම රහස් තියෙන්නෙ ගුහාවෙ විත්තිය.'

පාලිත කල්පනාකාරයෙකු මෙන් කී ය.

'ඒ වුණාට මුළු පළාත ම මේ රහස් දැනගන්නට වැඩි දවසක් යන්නෙ නෑ'යි මම කීවෙමි.

'ඒක ඇත්ත වෙන්න පුළුවන්. මම නෑ කියන්නෙ නෑ. ඒ වුණත් අපට පුළුවන් දැන් ගුණදාස සොයාගෙන තියෙන අළුත් මාවත දිගේ වතුර පාර ගලාගෙන යන්නට සලස්වන්න. අපි මේ කරන්නේ ඒකයි. මේකත් ඉක්මනට ඉවර වේවි. ඊට පස්සෙ අපට තීරණයක් ගන්න පුළුවන් ගහ අයිති කාටද කියල'යි පාලිත කීය.

'මේක මහා භාරදූර වැඩක්. එහෙම ලේසියෙන් තීරු
ගැනීම වැරදියි. අපි කවුරු හරි වැඩිහිටි කෙනෙ
ගෙන් අහගත්තොත් තේද හොඳ?'යි මම කීවෙමි.

'අපි මේ වැඩේ ඉවර කළාට පස්සෙ අහමු.' පාලි
මෙයට පිළිතුරු වශයෙන් කීය.

පාලිත හදිසියේ ම 'ගුණදස, ගුණදස'යැයි මොර දෙන්න
විය.

එහෙත් ගුණදස දකින පෙනෙන අහලකවත් නො වී ය.

'මම මෙතෙන්ට එනවයි කියූ වෙලාවට එන්න බැ
වුණා. මිනිහා සමහර වෙලාවට ඇතුලට යන්න ඇති.

අපි කලින් ගුහාවේ තැන් තැන්වල තැබූ ඉටිපන්දම් ඒ
තැන්වල නො තිබිණ. එහෙයින් අන්ධකාරයේ අත පත ගාමින්
ඉදිරියට ම ගියෙමු. මඳ දුරක් යන විට ඉටිපන්දම් එළියක
ආධාරයෙන් ඔහු ගේ මුළු ශක්තිය ම යොදා කාර්යයෙහි
නිරතව සිටියේ ය.

'ගිං ගඟ ඔය පළාත් දෙකට ම ගලාගෙන යනවට
මම කැමති නෑ. ඒ වුණත්; අළුත් මාවතට තව ම මම
දිය පාර හැරෙව්වෙ නෑ.'

ගුණදස මුහුණෙහි වූ දහඩිය පිස දමමින් කීය.

'මේ ගඟ පිළිබඳ ඔක්කොම රහස් ඉක්මනින්ම දැන
ගන්නට මිනිස්සු මහන්සි ගන්නවා. ගමේ මිනිස්සු
ගුහාව ඇතුලට ආවොත් ගුහාව තුළින් දිය පාර
පටන් ගන්නා බව සොයා ගනීවි. ඒ නිසා දැන් අපි

Scanned by CamScanner

කරන්නට තියෙන්නේ ඉක්මනින් ගහ ආපසු හරවා අපිත් පුළුවන් තරම් ඉක්මනින් ගෙදර යන එකයි.'

පාලිත ගුණදාසගේ මුහුණ දෙස බලා කීවේ ය.

'එහෙනම් අපේ ගමේ මිනිස්සු හෙට අනිද්දට මේ රහස සොයන්න ඒවි. හොඳයි අපි බලමු. ගහ ගැලුවත් මොකක් ද ඇති වැඩේ? ගහේ වතුරෙන් පළාත දියුණු කරන්න කවුද මහන්සි ගන්නේ? කුඹුරු අක්කර දහස් ගාණක් වපුරන්න පුළුවන්. ඒත් කාට ද ඕන? හැබැයි ගහ නැති දට මැරෙන්න හදනවා.'

ගුණදාස පණ්ඩිතයකු මෙන් කතා කරන්නට වූයේය.

'ගුණදාස ගේ කතාව ඇත්ත. ඒ වුණත් මේ ගහ අයිති අපේ ගමේ මිනිසුන්ටයි. ඒ වුණාට ඒ අය කම්මැළියි. දැන් කරන්න තියෙන්නේ දෙගොල්ලන්ට ම නොදී ගහ වෙන පැත්තකට හරවන එකයි' පාලිත කී ය.

'අපිට මේ වැඩේ ගල් සහ වැලිවලින් කරන්න බැරි ද? එහෙම පුළුවන් නම් අපිට කිසි බයක් නෑ. මේ අළුත් සිදුරු තුළින් ජලය ගලාගෙන යන්නට සැලැස්සුවොත් ඔක්කොම හරි.'

පාලිත වැඩි දුරටත් කී ය.

'ගිං ගහ පිටාර ගැලුවම අවුරුද්දකට ගෙවල් 1,000 කට වැඩිය විනාශ වෙනව කියල කියනවා.'

ගුණදාස කතා කෙළේය.

Scanned by CamScanner

'හබරාඩ ඇළ, තන්නීකීන ඇළ, උඩුගම් ඇළ මලාමුළු ඇළ, ගොල්ල ඇළ, මාතම දෙළ ඇළ, තෙරුන් ඇළ, මාබෙන් ඇළ, කිබි ඇළ, පුහුලුදුව ඇළ, හෝලුව ඇළ, ගොඩ ඇළ, කැප්පූ ඇළ මේ ඔක්කොම ඇළවල් මං ගිහින් බැලුවා. මේ ඇළවලින් ගලන ජලය ගඟට සම්බන්ධ වෙන්නට ඉස්සරින් පිටාර ගලනවා. ඇයි මේ ඇළවල් ශුද්ධ කරල ජලයෙන් තියම ප්‍රයෝජන ගන්න බැරි? කම්මැළි මිනිස්සු!'

පාලිත මොන තරම් කරුණු සොයාගෙන ඇත් දැයි මම කල්පනා කරන්නට වූයෙමි.

'ගං වතුර ගලන එක නතර කරන්නට බැරි දෙයක් නො වෙයි. බොහෝ ජල මාර්ග ශුද්ධ නොකිරීම නිසයි පිටාර ගලන්නේ.'

පාලිත ගේ කතාව ගුණදස පුදුමයෙන් මෙන් අසා ගෙන සිටී

'ඕලන්ද කාලයේ ද ගිං ගඟේ ප්‍රධාන ජල මාර්ග හොරගම්පිටියේ ඉඳල මහ මෝදරට එනතුරු කැප්පුවාය කියන ඇළ නිසා වාරි මාර්ග පහසු වෙලා තියෙනවා. ගං වතුරත් වැළක්වූ බව අපි භූගෝල පාඩමේ දී ඉගෙන ගත්තා.'

මම පාසැලේ දී උගත් පාඩමක් ගැන සඳහන් කෙළෙමි.

'ඉස්සර ගං වතුර තිබිල නෑ. ගිං තොට මෝය කට පළල් කර පහසුවෙන් ජලය මුදට යන්නට සලස්වා තිබුණලු. ඒ විතරක් නෙවි කැප්පු ඇළ කෙළවරින්

මහ මෝදරින් මුදට සම්බන්ධ වුණා. දූන් ගඟ දෙපැත්තේ අත්හැර දමා තිබෙන අක්කර දහස් ගණනක් ඉස්සර සරු සාර වගාවන් වෙලා තිබුණා.'

ඔවුන්ට මගේ භූගෝල ශාස්ත්‍රීය දැනීම පෙන්වන්නට ලැබීම ආඩම්බරයකි.

ගුණදාස ආරම්භ කළ වැඩය අවසන් කරන්නට ඔවුන් දෙදෙන බලවත් මහන්සියෙන් වැඩ කළහ. වතුර ගලා යෑම සඳහා කලින් තිබූ ජල මාර්ග දෙකම ගල්වලින් වසා දමා පිටතට නොපෙනෙන සේ වැලිවලින් බැම්මක් ද බඳින ලදී. ඔවුන් මේ කටයුත්ත මොන තරම් වුවමනාවකින් කරන ලද්දේ ද යන්න පැහැදිලි වූයේ අපට සිදුවන කිසි ම දෙයක් ගැන සොයා බලන්නට ඔවුන්ට ඒ අවස්ථාවේ වුවමනා නොවූ නිසා ය.

ගුණදාස අලුතෙන් සොයාගත් සිදුරු තුළින් වතුර ගලා බසින්නට පටන් ගත්තේය. මෙතෙක් අසන්නට ලැබුණු හඬට වඩා ඒ හාත්පසින් ම වෙනස් හඬක් විය. කුඩා ම පමණක් නොව මට වඩා වයසින් වැඩි අනික් දෙදෙනා ම බියෙන් ගල් ගැසී සිටියහ. මුළු ගුහාව ම නිල් පාට දියෙන් පිරී තිබෙන බව අපි දුටුවෙමු. ඉතා ම වේගයෙන් ගුහාව විලක් බවට පරිවර්තනය වනු ඇත. ගුණදාස සොයාගෙන ඇත්තේ ජල මාර්ගයක් නොව ලොකු බෙණයකි. වතුර ගලාගෙන යන්නට මාර්ගයක් නොතිබූ නිසා ගුහාව තුළ ම රැස් වන්නට විය.

'අනේ පාලිත මොකද මේ වුණේ ! අනේ ගුණදාස මොකද වෙන්න යන්නේ ! අනේ මට බයයි !'

මම විලාප දෙන්නට පටන්ගත් බව මතකය. එහෙත් මගෙන් පිට වූ අනෙක් වචන ගැන හරි හැටි මතක නැත. එහෙම නැත්නම් මම හඬන්නට ඇත.

Scanned by CamScanner

ඒ දෙදෙනාත් මා වගේ ම බියපත් වී සිටි අන්දම මට පෙනුණා ය. අනුක්‍රමයෙන් ජලමට්ටම ඉහළ නගින්නට විය. එපමණක් නොව ගුහාවට ඇතුළු වන්නටත්, ගුහාවෙන් පිට වන්නටත් තිබූ එක ම දොරටුවටත් ඉහළින් ජල මට්ටම නැඟ තිබිණ. අප මේ මුළු සවස් කාලය ම ගත කොට තිබෙන්නේ පොරොප්පය ගැසූ බෝතලයක් ඇතුළේ ජීවත් වන්නාක් මෙන් මන්දබුද්ධික ව ය. අවට සිදුවන දේ ගැන සොයා බලන්නටවත් අපට සිහි මොළේ නොතිබුණ හැටි. දැන් ජල කඳ අප මරණයේ දොරටුව කරා කැඳවාගෙන යන්නට සූදනම් වී සිටී.

‘අපට මරණයෙන් ගැලවෙන්නට කරන්නට තියෙන්නෙ එක ම දෙය යි.’

පාලිත වේගවත් අන්දමින් නොවූවත් බලාපොරොත්තු සහගත හැඟීමකින් කීය. එහෙත් ඔහු ගේ කටහඬ දුර්වල ය. එහි වූ ප්‍රාණවත් බව කොහේ ගියා ද කියා නැති තරම් ය.

‘ඒ කොහොම ද?’

මමත් ගුණදසත් එකවර ම ඇසීමු.

‘උඩුගම පැත්තට වතුර පාර හරවමු’ පාලිත කී ය.

‘මම නම් කැමති නෑ, ඒ වුණත් ඔය දෙන්නගෙ ගැලවීම සඳහා එහෙම කරමු. මම හිතන්නෙ නෑ ඒ වතුර පාර ලේසියෙන් මතු කරන්න පුළුවන් වෙයි කියල.’

ගුණදස කණගාටුවෙන් මෙන් කී ය.

උමංගම පැත්තට ජලය හැරවිය හැකි ජල මාර්ගය දැන් සම්පූර්ණයෙන් යට වී හමාර ය. ඒ ජල මාර්ගය වසා අප විසින් බඳින ලද බැම්ම ද ශක්තිමත් ය. එහෙයින් ඒ පාද ගැන්ම ලේසි පාසු කාරියක් නොවී ය.

පාලිත ගේ බුද්ධිය ඉතාමත් තියුණු ය. අපට මෙන් නො වේ. ඔහුට ඈත පෙනෙන නුවණක් තිබේ.

පාලිත ගැඹුරු හඬින් ගුණදසට කථා කළේ ය.

'මට දැන් උදව් කරන්න ඕනෑ, ගුණේ අපි මුණ පා තියෙන්නේ ඉතා ම භයානක තත්වයකට. තමුසෙ ළඟ තිබුණ ඉටිපන්දම් සුළඟට නිවෙන්න නොදී පරෙස්සම් කරගන්න ඕනෑ. ඒවා කොච්චර තියෙනව ද?'

'දහයයි. එයින් සමහරක් දිගයි. සමහරක් කොටයි.

ගුණදස කීය. ඔවුහු දෙදෙන වහා ඇඳුම් මාරු කොට පසෙකින් තැබූහ. එයින් පසු දෙදෙන ම ගුහාවේ මැදට ගියහ. වලස්මුල්ල පැත්තට දිය බැහැගෙන ගිය සිදුරට ඉතා ම ඉහළින් ජල කඳ ඉහළට නැඟ තිබිණි. සමහර තැන්වල දී පාලිත ගේ උසටත් වඩා ජලය තිබුණෙන් ඔහු පිහිනා ගෙන ගියේය. මොහොතකට පසු මට පෙණුනේ පාලිත ගේ හිසෙන් කොටසක් පමණය. එය ද ඉටිපන්දම් එළිය නිසා ය. ඔහු අතෙහි විශාල ගලක් ද තිබිණි.

'මෙන්න ඒ ගල්වලින් එකක්. තවත් මේ වගේ ගල් රාශියක් ම තිබෙනවා.'

පාලිත ඉඩ ලැබුණ මොහොතේ ම කථා කරන්නට පටන් ගත්තේ ය. ගුණදාසට පාලිතට මෙන් දක්ෂ අත්දමින් කිමිදෙන්නට පුළුවන්කමක් නොතිබිණි. පාලිත වරක් දිය යටට ගොස් නැවත මතු වන විට ලොකු කුඩා ගල් කිහිපයක් ම ඔහු ගෙන එයි. දෙදෙනා ම නො නැවතී කිමිදෙන්නට වූ හ.

මේ චිත්‍රය මා ඉදිරියේ දනුත් ඇඳී පෙනේ. මගේ මුළු සිරුරම බියෙන් ගැහෙන්නට පටන් ගනී. ඒ මොහොතෙහි මා ජීවත් වූයේ මෙලොවට ඇති සියලු ම ආශාවන් අත්හැර දමා ය. පාලිත හා ගුණදාස ද ශීතලෙන් ගැහි ගැහී බර වැඩෙහි යෙදී සිටිය දී මා කළේ ඉකි බිඳ හැඩීමය. ඔවුන්ට ආධාර වශයෙන් මට කළහැකි වූයේ ඉටිපන්දම් වැටි කිහිපය නිමෙන්නට නොදී ආරක්ෂාකර ගැන්ම ය. ඉකි බිඳිමින් වුවද මම එය හරිහැටි කළෙමි. ඔවුන් කළ බරපතල වැඩ දෙස බලන විට මගේ අතින් කිසි ම සේවයක් සිදු නොවී යැයි කීව ද වරදක් නොවේ. අද මෙන් අදත් මම එඩිතර එකෙක් නොවීමි.

නිමේෂයක් පාසා ඉහළ නගින ජල මට්ටම දැකීමෙන් අප මුහුණ පා තිබෙන භයානක විපත්තිය වැඩියෙන් අවබෝධ කර ගන්නට මට පුළුවන් වුණේ මා එක තැනකට වී ඉටිපන්දම් වැටි අල්ලාගෙන සිටීමත්, ඔවුන් දෙදෙනාම කිසි ම දෙයක් ගැන සිතන්නට ඉඩක් නැති ව වැඩෙහි ම යෙදී සිටීමත් නිසා ය.

මේ භයානක විපත්තියෙන් ගැලවී යන්නට නම් අඩු ගණනේ තවත් ගල් විස්සක් වත් එහා ඉවත් කළ යුතුය. දැන් ගල් ඉවත් කිරීමට පටන්ගත් අවස්ථාවට වඩා අමාරුය.

මන්ද, කිමිදී යත්නට ම සිදුවූ නිසාය. එහෙයින් මගේ මිතුරන් දෙදෙනා වඩ වඩාත් උනන්දුවෙන් ක්‍රියා කළ බව මට පෙනිණි. ඔවුන් දෙදෙනාගේ ධෛර්‍ය්‍යය නම් සුළු වශයෙන් වත් අඩු වී තිබුණේ නැත. කාර්යක්ෂම අන්දමින් නොපසුබට උත්සාහයෙන් ක්‍රියා කළ මගේ මිතුරන් දෙදෙනා තවත් ගල් හතරක් ම ඉවත් කරනු බලා සිටියෙමි. ජල මට්ටම ඉහළ නැඟීම නතර විය. ඒ වෙනුවට ජලය මඳින් මඳ ගලා බස්නා බව පෙනෙන්නට තිබිණි. අපි සන්තෝෂයෙන් ඉපිල ගියෙමු.

පාලිතත් ගුණදාසත් වඩාත් මහන්සියෙන් වැඩ කළ නමුත් එයින් එතරම් ප්‍රයෝජනයක් ලැබුණේ නැත. අනෙක් ගල් සවි කොට තිබූ අන්දමට ඒ ඉවත් කිරීම ලේසි පාසු වැඩක් නොවී ය. ඒ හැරෙන්නට දෙදෙනාම ඉතා ම වෙහෙසට පත්ව සිටිය හ. එහෙයින් ගල් ඉවත් කිරීම පිළිබඳ උත්සාහය සිතින් අත්හැර දමන්නට අකැමැත්තෙන් වුව ද ඔවුන්ට සිදු විය.

ඇත්ත වශයෙන් ඔවුන් දියෙන් ගොඩට ආවේ එක දිගට වෙහෙසවීම නිසා තවත් දුරට වැඩ කිරීමට ශක්තියක් නොතිබීම හේතු කොට ගෙනය.

'දැන් ඉතින් වෙනත් උපායක් ගැන කල්පනා කරන එක හොඳයි' යි පාලිත කීය.

'මොන විධියේ උපායක් ද' යි මෙතෙක් මර බයෙන් පසු වූ මම පාලිතගෙන් ඇසීමි.

ඔවුහු දෙදෙනා යළිත් තම ඇඳුම් ඇඟ ලා ගත්හ. දැන් ජීවත් වීම පිළිබඳ කිසි ම බලාපොරොත්තුවක් අප එකතු ළඟවත් නැත. මෙතැනින් ගැලවී වෙනත් තැනකට පැන

ගන්නේ කෙසේදැයි අපි එකිනෙකා කල්පනා කළෙමු.

'අපිට වෙන්නෙ මෙතැනම මැරෙන්න'යි මම කීවෙමි.

'වහලේ සිදුරක් හෝම තියනව ද බලමු'යි පාලිත කීය.

'මැරෙන්න යන එකා තණකොළ ගහේ හරි එල්ලෙන්න එපායැ?'

ඒ කීවේ ගුණදස ය. එහෙත් කිසිවෙකුට ඒ කීම සඳහා සිනාවෙන්නට තරම් සන්තෝෂයක් නැත. මරණය අපට අත වනමින් සිටින බව අපි දනිමු.

අප ළඟ ඉතිර වී තිබුණේ එකම ඉටිපන්දම් වැටියයි. එහි අඳුරු ආලෝකයෙන් ගුහාවේ වහලෙහි සිදුරක් ඇද්දැයි සෙවීම අපේ ඊළඟ උත්සාහය විය. තිදෙන ම එක් ව සිදුරක් ඇත්තේ කොයි දැයි සොයන්නට පටන් ගතිමු.

වහලෙහි සෑම තැනක් ම ඒකාකාරව පිහිටා නොතිබිණි. එක් තැනක් උඩට නෙරා තිබුණේය. තවත් තැනක ලොකු බෙණයක් විය. මේ එකින් එක අතර මොන තරම් වෙනස්කම් වීදැයි සිතාගන්නට අපට ඉඩක් නො තිබිණි. කලින් අපේ අතෙහි වූ ඉටිපන්දම් වැටි නිවා දමන ලද්දේ මේ වෙනස ඔස්සේ ආ සුළඟින් බව දූන් අපට ස්ථිර වශයෙන් සිතාගන්නට හැකිය.

අනෙක් දෙදෙනා විසින් මා ඔසොවා කෙළවර වූ ගැටියෙහි තබන ලදහ. ඔවුන් දෙදෙනාගේ ඉල්ලීම පරිදි මම එහි වැතිර වම් අතින් ගැටිය තරයේ අල්ලාගෙන දකුණු අත පහළට දිගු කළෙමි. මගේ අතේ ආධාරයෙන් ගුණදස ද ඉහළට නැඟ

ගත්තේ ය. අපි දෙදෙනම එකතුව පාලිතට නැඟ ගන්නට උදව් කළෙමු.

උසම තැනකට නැඟ ගත් පසු නො කළහැකි දෙයක් නොවූයෙන් අප නොදුටු වෙනත් සිදුරකින් ජලය ගලා ගෙන යන්නට සලස්වන්නැයි මම දෙවියන් යදින්නට වූවෙමි.

පාලිතත්, ගුණදසත් බලවත් වෙහෙසට පත් ව සිටි හෙයින් ඔවුහු දෙදෙන එවැන්නක් ගැන සිතීම පසෙක තබා මාන්සි නිවන්නට වූහ. කල්පනා කරන්නට තරම් නිශ්චල සිතක් තිබුණේ මට පමණ ය.

"දැන් දිය මට්ටම ඉහළ නඟින්නේ"යි මම කීවෙමි.

"එහෙනම් අපි දියේ ගිලිල මැරෙන්නෙ නෑ. නමුත් කන්න නැතුව මැරෙන එක සහතිකයි."

ඒ කීවේ පාලිතය.



Scanned by CamScanner

# 4

ජල මට්ටම ඉහළ නැඟීම නතර වූ බව ඇත්ත ය. එහෙත් ගුණදාස වාඩි වී සිටි වහලේ කණ්ඩියේ සිට ඒ අතින් ඇල්ලිය හැකි තරම් විය.

ජල මට්ටම ඉහළ නැඟීමක් නොවන නිසා මේ මරු කපොල්ලෙන් කෙසේ හෝ ගැලවී යන මඟක් සොයා ගන්නට අපි දහ අතේ කල්පනා කළෙමු.

'සමහර විට මේ ගුහාවෙන් අපට පිටතට යන්නට පුළුවන් සිදුරු තියෙන්නට පුළුවන්. අන්ධකාරයෙන් ගුහාව වැහිල නිසා ඒ විධියේ සිදුරක් තිබුණත් අපට පෙනෙන්නේ නෑ. ඒ නිසා අපට කරන්නට තියෙන්නේ ගුහාව පුරා ම ඉටිපන්දමක් යවන එකයි.'

පාලිත තවත් කල්පනාවක් අප ඉදිරියේ තැබීය.

'ඒක හොඳයි. ඒත් කොහොම ද ඉටිපන්දමක් අරන් ගුහාව ඇතුළෙ යන්නෙ? මේක වතුරෙන් පිරිලා'යි ගුණදාස ඇසී ය.

'ඒක සිම්පල් මම කියන්නම්කො කරන්නෙ කොහොම ද කියල'

කතා කරමින් ම පාලිත ඔහුගේ හිසෙහි වූ පත් තොප්පිය අතට ගත්තේ ය. ඒ මැද ඉටිපන්දම් වැටිය සවි කරන්නට ඔහුට ගතවුනේ විනාඩියකි. වතුර දෙසට පාත්වූ පාලිත සෙමෙන් තොප්පිය වතුර මත දමා පා කර හැරියේ ය.

ඉටිපන්දම් වැටිය දල්වා ගත් තොප්පිය බෝට්ටුවක් මෙන් එහා මෙහා පැද්දෙන්නට විය. වරක් ඒ ගුහාවේ ඒ කොනට යයි. තවත් වරක් මේ කොනට පා වී එයි. අත්පුඩි ගසමින් තොප්පිය පා වී යන අන්දම ගුණදාස බලා සිටියේ පුංචි ළමයකු වගේ යි. එහෙත් පාලිත තියුණු ලෙස තොප්පියේ වූ ඉටිපන්දමෙන් ආලෝක වන ගුහාවේ වහල දෙස බලා සිටී. තොප්පිය ගුහාවේ පා වී නොගිය අඳුරු මුල්ලක් නැති තරම් ය. දැන් අපේ බලාපොරොත්තු සියල්ල සුන්වී ඇත. මෙතැනින් ගැලවී යන්නට පුළුවන් කමක් ඇති වෙතැයි තවත් දුරට බලාපොරොත්තුව තබාගෙන සිටීම පවා මෝඩකමකි. අඳුරෙහි පැවූ කුඩා තරුවක් මෙන් තොප්පිය ගුහාවේ තවත් කොනකට පාවී ගියේ ය. ටික වේලාවක් තොප්පිය අපේ දර්ශනයෙන් ඉවත් විය. අපි නෙත් දල්වා බලා සිටියෙමු. තොප්පිය නැවත වරක් දකින්නට වූයෙන් අපි ඉමහත් සතුටට පත් වූවෙමු. එහෙත් අපට නැවත වරක් මිනිසුන් අතරට යන්නට තරම් වාසනාවක් ඇතිවේ යැයි කිසිම බලාපොරොත්තුවක් ඇති කරගත හැකි නො වී ය. මරණය ඇත්තේ අපේ අතේ දුර ය.

"මේ ඔක්කොට ම වැරදි කාරයා මම."

පාලිත කීය. ඔහුගේ මුහුණ අඳුරු ය. පෙනුම දුක්මුසුය.

"නෑ නෑ වැරදිකාරයා මමයි. මම මගේ ගානට වැඩියෙන් ලොකු මිනිහෙක් කියල හිතා ගත්තා. මේ ඔක්කොම වුණේ මගේ පණ්ඩිතකම නිසයි. අලුත්

පැත්තකට වතුර පාර හරවන්නට ගියායින් වෙච්ච දේ.'

දිග සුසුමක් හෙළමින් ගුණදාස කී ය.

ටික වේලාවක් අප තුන් දෙනාම කිසි කථාවක් නැතිව නිශ්චල ව සිටි පසු තිහඬ බව බිඳිමින් මම කථා කළෙමි.

'අප තුන් දෙනා ම දෙවියන්ට කියමු.'

මගේ කීමට පාලිතත්, ගුණදාසත් එකඟ වූහ. ටික වේලාවක් යන විට ඉතා මහන්සියට පත්ව සිටි ඔවුහු දෙදෙනම නින්දට වැටී සිටියහ.

ඔවුන් තරම් මා නො වෙහෙසුන බව ඇත්තය. එහෙත් අප වැටී සිටින භයානක ඉරණම ගැන ඔවුනට වඩා බියක් හා දුකක් ද මා තුළ ඇත. මා තරම් ඒ සම්බන්ධයෙන් දුක් වන්නට ඔවුන්ට නුපුළුවන් ඇයි?

'දෙවියන්ගේ පිහිට විතරක් ඉල්ලුවාට මදියි. අපි අපේ නිර්භීත භාවයත්, යුද්ධකාමීත්වයත් සතුරන්ට පෙන්විය යුතුයි.'

සතුරු හමුදාවක් විසින් සතර වටින් ම වටකර ගෙන සිටිද්දී තම හමුදාව අමතා එක් රෝම ජාතික රජකු කළ ප්‍රකාශය මගේ සිහියට නැගිණි. ඉතිහාස පාඩම උගනිද්දී ඇසූ ඒ පාඨය මොන තරම් වැදගත් ද? මේ අවස්ථාවේ මේ ඉතිහාස පොතේ ආ කතාව මට සිහිපත් වූයේ ඇයි? ඇත්ත වශයෙන් අප මුහුණ පා සිටින අනතුරින් ගැලවී යන්නට කල්පනා කිරීම පවා මෝඩකමකි. කෙසේ හෝ වේවා, ගමේ මිනිසුන් කියන්නාක් මෙන් බෝතල කටෙන් ආ මිනිහා බෝතල කටෙන්ම පිට වී යා යුතුය යා හැකි ක්‍රමයක් ගැන මම තනිව ම කල්පනා කරන්නට වූවෙමි.

Scanned by CamScanner

බොහෝ වේලාවකට පසු එක් සිදුරක් මට දකින්නට ලැබිණ. සිදුර කොතරම් ගැඹුරු දැයි දැනගනු පිණිස ගල් කැටයක් විසි කළෙමි. ගල් කැටය සිදුර තුළින් ගොස් වැටෙන හඬ මට ඇසුණේ ටික වේලාවකට පසුව ය. මෙයින් මා තේරුම් ගත්තේ අප සිටි ගුහාවට එහායින් වෙනත් ගුහාවක් ඇති බව ය.

ඒ මොහොතෙහි ම යම් කිසි හුරු පුරුදු කට හඬක් ඇසුණෙන් මම ගල්ගැසී ගියෙමි. දනුදු ඒ සිහිපත් වන විට මගේ ඇඟේ ලොමු දැහැ ගනී. අද පවා, තැති ගැනුමක් නැති ව එහි වූ හැඟීම් විස්තර කරන්නට මම අපොහොසත් වෙමි.

මුලින් ම කූඩුවක සිර කර තබන ලද කුරුල්ලකු එයින් මිදී ගත් විට ලබන සන්තෝෂය කොපමණ ද? ඒ විධියට වචනයෙන් කිව නොහැකි තරම් විශාල ප්‍රීතියක් මා තුළ ඇති විය. අර කලින් මා දුටු සිදුර තුළින් මිනිස් කට හඬක් ඇසීම ය මගේ මහත් ප්‍රීතියට හේතු වූයේ.

'ඒ ගල කොහෙන් ද ආවේ?'

ඒ නම් අර හන්දියේ කඩකාරයා ගේ කටහඬ ය.

'ආවේ කොහෙන් ද කියල කියන්න මම දන්නෙ නෑ. තව ටිකෙන් ඒ ගල නිසා මගේ ඔළුව පැළෙන්න තිබුණා.'

ඒ වඩු බාස් ගේ කට හඬ බවට මට සැකයක් නැත.

'පාලිත ගුණදස' යැයි මම මහ හඬින් කතා කළෙමි. මා

අපි සෙමෙන් ඔවුන් අතර කෙරෙන කතා බහට කන්දී සිටියෙමු.

'ඔය ගල ගහන්න ඇත්තෙ අර ළමයි වෙන්නට ඕනෑ. ඒ ගොල්ලන් අපි ව බයකරන්නට හිතන් ඇති'යි හන්දියේ කඩකාරයා කී ය.

'මෙහෙම යස්ස ළමයි වගයක් මං කවදාවත් දැකලා නෑ. ඒ ගොල්ලන් සෙල්ලම් කරන්න තමයි මේ ඇවිදින්නේ. ඔය ගොල්ලන්ට මේ වැඩේට හොඳ පාඩමක් ඉගැන්නුවෙ නැත්තම් මගේ නම කියන්න එපා.'

ඒ කීවේ වඩුබාස්ය. ඔවුන් අර සිදුර දිගේ බොහොම අමරුවෙන් උඩට නගින හඬ ඇසිණ. ටික වේලාවකට පසු හන්දියේ කඩකාරයා අප සිටි අසලට පැමිණියේ ය.

'ආ.....ආ.....ආ.....මේ ඉන්නේ'යි

කියමින් තව එකෙක් කෝටුවක් වනමින් පැමිණියේ ය. ඔහු කලබල වී සිටියේ ය. පරිස්සමින් හීන් සීරුවේ නගින්නට

උත්සාහ නොකිරීම නිසා ඔහු අඩි තිහක් පමණ පහතින් වූ දියට 'ජංබෝ' ගා වැටෙනු දැක අපට සිනා නො වී සිටීමට නොහැකි විය.

හාන්දියේ කඩකාරයා ගුණදාස සමඟ වෛරයෙන් සිටියෙකි. එහෙත් මේ මොහොතේ පරණ එදිරිවාදිකම් වලින් වැඩක් නැත. විපතට පත් ඔහුට පිහිට වීම මනුස්සකමය.

'ඔහු මැරෙන්නට නො දී බේරගන්නට ඕනෑ.'

පාලිත කෑ ගැසීය. ගුණදාස ඒ අනුමත කරමින් වහා දිව ගියේය. කඩකාරයා පිහිනන්නට දැන සිටි හෙයින් තත්ත්වය ඒ තරම් බරපතල නොවී ය.

'අම්මෝ - මගේ බුදු අම්මෝ! මං මැරේවි.' කඩකාරයා ගේ මර ලතෝනිය නිසා මම බෙහෙවින් බියපත් වුණෙමි.

'මං කළ පව් මට පල දෙන්න හදනව ද අම්මේ? ආයෙත් නම් පව් කරන්නෙ නෑ දෙයියනේ! මාව බේරගන්න කවුරුත් නැද්ද දෙයියනේ?'

මගේ ඇස් දෙකින් කඳුළු ගලන්නට විය.

ගුණදාස ගේ හතුරා වූ කඩේ මුදලාලි ගේ මර ලතෝනියට ඔහු පරෙස්සමින් කන්දී සිටියේ ය.

'මම තමුසෙව බේරගන්න කැමතියි. තමුසෙ ඒකට කැමති ද?'

'අනේ මාව බේරගන්න ගුණදාස, මාව බේරගන්න,

Scanned by CamScanner

පින් සිද්ධ වෙයි.'

'මුදලාලි මේ බලනවා. තමුසෙ ජීවිතේ කවදාවත් කරුණාවන්ත මිනිහෙක් වෙලා හිටියෙ නෑ. තමුසෙ කරපු තරමක් කළේ අපරාධ, දුප්පත් මිනිසුන් මහට බැස්සුවා. තමුසෙ නිසයි මගේ මව්පියන්ට උන්හිටි තැනුත් නැතුව ගියේ. තමුසෙ අද මරණෙන් බේරිලා ගියොත් අර පරණ පව් ආයෙත් කරන්නට පටන් ගන්නවා. දුප්පත් අසරණ මිනිසුන් පෙළන්නෙ නෑ කියල දිවුරුවොත් විතරයි අපි තමුසෙව බේරගන්නෙ. තේරුණා ද?'

'අනේ දෙයියනේ මම පොරොන්දු වෙන්නම්. එක පාරක්, දෙපාරක් නෙවි, දහස් වරක් පොරොන්දු වෙන්නම්.'

'තමුසෙ පොරොන්දු වෙලා ගිහින් ඒක ඉෂ්ට නොකළොත්?

'මගේ මුළු සේසත ම ගුණදසට අයිතියි.'

'හොඳයි ඒක කොහොම ද කරන්නෙ?' පාලිත කතාව මැද්දට පැන්නේ ය.

'තමුසෙලා හිතනව ද මම දියේ ගිලී මැරෙයි කියලා.'

මුදලාලි ආයෙත් සුළු ආත්ම ශක්තියක් ලැබූවකු මෙන් කතා කළේ ය.

'තමුසෙ තව පැය බාගයකින් මැරෙනවා. තව පැය බාගයක් යන කොට තමුසෙගෙ ඔළුවට අඩි තුනක් උඩින් වතුර, තේරුණා ද?'

පාලිත ගොරහැඩි ලෙස කීය.

'අනේ මං මැරෙයි ද? මං මැරෙයි ද පුංචි මහත්තයෝ?'

'දැන් මම කීව නෙ? තමුසෙ තව ජීවත් වෙන්නෙ පැය බැගයයි.'

'දැන් ඉතින් දෙයියන්, බුදුන් සිහි කර ගන්නවා.'

'අනේ, දෙයියනේ පුංචි බුදු මහත්තයෝ රත්තරන් මහත්තයෝ, මාව ගලව ගන්න මහත්තයෝ.'

'හොඳයි තමුසෙ කතරගම දෙයියන් ගැන දිවුරනවා. අර පොරොන්දුව ඉෂ්ට නොකළොත් තමුසෙගෙ මුළු බුදලය ම ගුණදාසට අයිතියි කියල.'

'හොඳයි මම පොරොන්දු වෙන්නම්.'

'පොරොන්දුව ඉෂ්ට නොකළොත්?'

'මගේ ඔළුව හතට පුපුරල, මැරෙයි.'

පාලිත ඔහුට වුවමනා අන්දමින් මුදලාලි ගෙන් පොරොන්දුව ගත්තේ ය. කතරගම දෙවියන්ට පොරොන්දු වන අන්දමින් මුදලාලි දෙ අත් හිස මත තබා පොරොන්දුව මහ හඬින් කිය වී ය.

'අන්න හරි, දැන් අපි තමුසෙට උදව් කරනවා.'

පාලිත හා ගුණදාස ද බිම වැතිර ගත්හ. ඔවුන්ගේ දෙඅත්

Scanned by CamScanner

...ණ්ඩියෙන් පහතට දමා මුදලාලි ඉහළට ඔසවා ගත්හ.

'දෙයියන්ට පින් සිද්ද වෙච්චාවෙ. මම මරණෙන් ගැලවුණා.'

මුදලාලි ගේ මුහුණ පුරා සන්තෝෂය වැතිර ගෙන තිබිණි.

'මේ කණ්ඩිය බොහොම පටුයි. ඒ නිසා තමුසෙට ඉන්නට පුළුවන් වෙන්නේ යන්තමටයි. තේරුණාද?'

පාලිත කී ය.

'අපි පුළුවන් තරම් ඉක්මනින් මේ අඳුරු ගුහාවෙන් පිටවෙලා යන්නට බලමු.'

'ආයුබෝවන් මුදලාලි අපි මේ හැමතැනම තමුසෙව හොයනවා.'

'කවුද ඒ කතා කරන්නෙ? මට ඒ මිනිහව පේන්නෙ නෑ!'

පාලිත ඒ කීවේ ගොරෝසු හඬකිනි.

අපි සියලු දෙනාම කඩකාරයා දියේ ගිලුණ තැන බැලීමු. ...හෙත් කඩකාරයාගේ යාළුවා නම් එහි නොසිටියේ ය.

'කමක් නෑ, අපි මිනිහව හොයමු.'

'අපි කොහෙන්ද යන්නේ?' මුදලාලි ආපසු යන පාර අසමින් ඉදිරියට යයි.

'ආ! දෙයියනේ අපිට මෙතැනින් ගැලවී යන්නට බැරිද?'

Scanned by CamScanner

අප සිරමැදිරියක් වැනි තැනක සිරවී සිටින වග මුදලාලි තේරුම් ගත්තේ දැන් ය. ආයෙත් මිනිසුන් අතරට පණ පිටින් නම් යන්නට නොලැබෙන බව ඔහු තේරුම් ගත්තේ ය.

'තමුසෙගෙ යාළුවා අපිව ගලවා ගන්නට එනතුරු අපට යන්නට ලැබෙන්නේ නෑ. එයා නාවොත් තත්ත්වය හුඟක් බරපතල වෙන්නට පුළුවන්. පසුගිය පැය දෙකක් තිස්සේ අපි තුන් දෙනා මේ පටු කණ්ඩිය උඩ මාරයා සමග සටන් කරමින් හිටියා. දැන් වඩු බාස් නාවොත් මරණයට කැපවී සිටින ගණන හතරක් වෙනවා.'

වඩු බාස් හදිසියේ නො පෙනී යාම ගැන පාලිත නිර්භීත අන්දමින් කතා කළත් කවුරුනුත් පාහේ ඔහුගේ පැමිණීම බලාපොරොත්තු වන බව මුහුණුවලින් ම කියැවිණි.

'ඔහු හේතුවක් නැති ව අපි ව අත්හැර යන්නේ නෑ. ඔහු යන්නට ඇත්තේ අප ගලවාගන්නට ලේසි ක්‍රමයක් සොයා ගන්නටයි. ඒ වුණත් එයාට එවැනි ක්‍රමයක් සොයාගන්නට බැරි වුණොත්..........?'

'අපි සියලුදෙනා ම පුංචි අත්තක වසා සිටින කුරුලු රංචුවක් වගෙයි. මේ පටු කන්ඩියෙන් අප කැඳවා ගෙන යන්නට එයා එන්නට ම ඕනැ' මුදලාලි කීය.

'එයා අපව මෙහි දමා ගියොත් මහා ම දුෂ්ටයෙක්'යි

මම කණගාටුවෙන් කීවෙමි.

'යම් විදියකින් මට මෙතැන ඉඩක් තියෙනවා නම් මම...........' ඔහු අවසන් නො කොට කතාව නතර කළේ ය.

'නිකම් ඉන්නවා. එහෙම නේ ද?'

පාලිත ඇසී ය.

'තමුසෙ එහෙම කියන්නේ කොහොම ද? හැම විනාඩියක් පාසා ම දිය මට්ටම ඉහළ නගිනවා නේද.'

මුදලාලි කතා කරන්නේ මරණ බියෙනි.

'ඔව්, ඔව්, දිය මට්ටම ඉහළ නගිනවා. දැන් එය මගේ දෙ පතුල තෙක් ඉහළ නැඟ තියෙනවා.'

පාලිත කණ්ඩියෙන් පහත වූ වතුර දෙසට දෙපා දමා ගෙන කතා කරයි.

Scanned by CamScanner

# 5

මුදලාලි අපේ කල්ලියට එකතුවීමෙන් පසු අප විසින් වඩාත් සැලකිලිමත් නො වුව ද වතුර මට්ටම සෙමෙන් සෙමෙන් ඉහළ නගිමින් තිබුණේ ය. බලාපොරොත්තු මොන තරම් තදින් තිබුණ ද වඩුබාස් අප ගලවා ගැනීම සඳහා නම් නො පැමිණියේ ය. දැන් ජීවිතය ගැන තිබූ බලාපොරොත්තු අත්හරින අන්තිම මොහොත පැමිණ තිබේ. අපේ දෙපා පවා වතුරෙන් තෙමෙන තරමට ජල මට්ටම ඉහළ නැඟ ඇත. මුදලාලි දැනටමත් පිස්සු වැටී සිටී. ඔහුට කතා කරගන්නට පවා හොඳ සිහියක් නැත. 'මරණයෙන් බේරිලා යන්නට ලැබුණොත් මේ ළමයි තුන්දෙනා ව මම ජීවිතේට අමතක කරන්නෙ නෑ. මට කරන්න පුළුවන් හැම උදව්වක් ම කරනවා.' මුදලාලි තොල් මතුරන්නට විය.

'අනේ මේ පුංචි ජයාවත් තමුසෙ වගේ බය ගුල්ලෙක් නෙවි. තමුසෙට බැරි ද ටිකක් කට පියාගෙන ඉන්න?'

ගුණදස ඔහුට බනින්නට පටන් ගත්තේ ය.

ගුණදස ගේ බැණුමෙන් පසු ඔහු තව වචනයක් වත්

Scanned by CamScanner

...තා කළේ නැත. 'බලාපොරොත්තුව දුප්පතාගේ සදාකාලික ...හාරය'යි කියූ කතාව සත්‍යයක් කරන්නට මෙන් අපි අපට ...වූ එක ම බලාපොරොත්තුව වූ අර සිදුර දෙස ඇසිපිය ...නා හෙළා බලා සිටියෙමු. එයින් කණාමැදිරි එළියක් වැනි ...ළියක් මතු විය. හදිසියේ ම දුබල හඬක් ද ඇසෙන්නට ...යේ ය. අපේ සිත් තව තවත් එළිය කරමින් අර කණාමැදිරි ...ළි ටික ටික වැඩි වන්නට පටන් ගත්තේ ය.

මිනිසුන් කිහිප දෙනකු විදුලි පන්දම් කිහිපයක් ද අතැතිව ...ටින බව පෙනේ. ඔවුන් ගේ අත්වල දිග කඹ දක්නට විය. ...වුන් පැමිණි බව ඔවුහු හඬ ගා කීහ. අපිදු පිළිතුරු දුනිමු.

'දෙවියන්ට පින් සිද්ධ වෙයි. ඉක්මන් කරනවා ඕයි!'

මුදලාලි ආයෙත් දෙඩමලු විය.

ඔවුන් අතර වූ කතා බහෙන් පසු එකෙක් මෙසේ කීය.

'අපි කඹයක් විසි කරනවා. එහි ගැටයක් ගසා ගෙන ඒකෙ උදව්වෙන් අල්ලා ගෙන ඉන්න ඕනෑ. ඊට පස්සේ අපි උස්සල ගන්නවා. එක වරකට ගන්න පුළුවන් එක්කෙනයි. තේරුණාද?'

'එහෙම නැත්නම් කඹය ඉණේ ගැට ගසා ගෙන දියට පනින්න. එතකොට අපිට පුළුවන් කඹයේ උදව්වෙන් උස්සල ගන්න.'

'ඔව්, ඔව් බොහොම හරි, ඒක තමා කරන්න තියෙන්නෙ.'

මුද[illegible] මරණ බයෙන් නන් දෙඩවන්නට විය.

Scanned by CamScanner

'ඉක්මන් කරන්න. මම දැන් මරණයට ළං වෙලා ඉන්නෙ. දෙන්න මය ලණුව මට.'

මුදලාලි දිගටම කතා කරයි.

'එහෙම හොඳ නෑ මුදලාලි.'

ඒ කණ්ඩායමේ එකෙක් කීය.

'ඉස්සෙල්ලම ගන්න තියෙන්නෙ ළමයින්ව, ඔක්කොටම ඉස්සෙල්ල පුංචි ළමයව ගන්න ඕනෑ.'

'අනේ මට වැරදිලා කියවුණේ; තරහ වෙන්න එපා. සමාවෙන්න.'

මුදලාලි ගේ කතාව නතර කරන්නට නොහැකි විය.

කඹයේ කෙළවර අප සිටි තැනට විසි කරන ලද්දේය. ඒ මගේ ඉණ වටා ගැට ගසන ලද්දේ පාලිත හා ගුණදාස ද විසිනි. සිතට බියක් ඇති වුව ද එයින් පසු මම දියට පැන්නෙමි.

මොහොතක් ඒ අතට මේ අතට පැද්දී පැද්දී සිටීමෙන් පසු මිනිස්සු සියළු දෙනා ම එකතුව මා උඩට ඔසවා ගත්හ. ඒ මොහොත වන තුරු ම ජීවිතය පිළිබඳ ආසාවන් අත්හැර සිටි මම ප්‍රීතියෙන් පිනා ගියෙමි.

දෙවැනි වරට ඔසවා ගන්නා ලද්දේ පාලිතය. මුදලාලි දුක්මුසු අන්දමින් බලන්නට වූයේ පාලිතත් එහා ගොඩට ගියායින් පසුව ය. ඔහුගේ මුහුණෙහි දුක, අඳුර, වේදනාව

Scanned by CamScanner

ප්‍රමාණයක් නොව එබඳුම තවත් හැඟීම් රාශියක් සිත්තම් වී තිබිණ. ගුණදාසට කලින් තමාට යන්නට අවසර දෙන්නැයි ඔහු බැගෑපත් අන්දමින් ඉල්ලා සිටියේය.

'හොඳයි ඒ වුණත් ඔබ මගේ කොන්දේසියට එකඟ වන්න ඕනෑ'යි.

ගුණදාස කීය.

'ඕන කොන්දේසියකට මම එකඟ වෙනවා, මොකක් ද කොන්දේසිය? කියන්න.'

ගුණදාස ඔහුගේ පොකැට්ටුව ගෙන එහි වූ කුඩා සටහන් පොතක් එළියට ගත්තේ ය. ඉටිපන්දම් වැටියක ආධාරයෙන් එහි මොකක්දෝ ලිවී ය.

ඒ ලියා හමාර වී

'හා හොඳයි, මෙයට අත්සන් කරන්න. එතකොට තමුසෙට මම ඉස්සෙල්ලා යන්න දෙනවා.'

'ගුණදාස ගේ මව්පියන්ගෙන් අසාධාරණ ලෙස අයි කරගෙන සිටින ගෙයත් ඉඩමත් කිසිම ගාස්තුව නැති ව ඔවුන්ට ආපසු පවරා දෙන්නට මම මෙයි ගුණදාසට පොරොන්දු වෙන්නෙමි.'

මුදලාලි කිසිම කතාවක් නැතිව පැන්සල ගෙන අත්සන් කරන හැටි පාලිතත් මමත් සිනාමුසු මුහුණින් සිටියෙමු.

Scanned by CamScanner

තුන් වැනි වරට කඹය වීසි කරන ලද්දේ ය. තරබාරු මුදලාලි ගේ ඉණ වටා කඹය ගැට ගසන ලදී. ඔහු නොදැනුවත්වම ඉහළට ඔසවා ගන්නා ලදී. ඉහළ සිටි අයගේ ශරීර ශක්තිය නොවත්තට මුදලාලි උඩට ඒම එතරම් ලේසි පාසු වැඩක් නොවත්නට තිබිණි. අවසාන වරට කඹය වීසි කරන ලද්දේ ගුණදාස ඉහළට ඔසවාගනු පිණිස ය.

මේ භයානක මරු කපොල්ලට අප මැදි වූයේ කෙසේ ද? යන ප්‍රශ්නය වැල නො කැඩී අසන්නට වූහ. ඔවුන් අසන ලද ප්‍රශ්නවල කෙළවරක් නැත. එහෙත් 'හෝ හෝ හෝ' යන හඬින් එක වරට කඩා වැටුණ මහ හඬින් අපි සියලු දෙනා ම භය බිරාන්ත වී ගියෙමු. හැම දෙනාට ම දිය ඇල්ල දෙස බැලුණේ ඉබේට ම ය. මොහොතකට කලින් ගිලගන්නට උත්සාහ කළ මාරයකු වැනි ඇල්ලේ තද නෙද බිඳී අවසාන ය. ජීව වායුව පිට කරන්නට උත්සාහ කරන මරණාසන්න ලෙඩකු මෙන් පණ අදින්නාක් වැනි හඬකින් දිය ඇල්ල හෙමින් සීරුවේ ගලා බසින්නට පටන් ගත්තේ ය. හැබැයි වතුර පහර ගලන්නට පටන් ගත්තේ කතරගම පැත්තටයි. අන්තිමේ දී එක වතුර පොදක් හෝ ඉතිරි නො කොට සියල්ල ගලා හමාර විය.

සිද්ධිය සම්බන්ධයෙන් අපි සාකච්ඡා කළෙමු. මුදලාලිත් වඩු බාසුත් ගුහාව පරීක්ෂා කරන්නට පිටත් ව ගියහ. විදුලි එළියක ආධාරයෙන් ඔවුහු එක එක ගුහාව නැරඹූ හ. ගුහාවන් පිළිබඳ සැබෑ රහස් ඔවුන් දන සිටියේ නැත. දිය ඇල්ල පටන්ගත්තේ කොතැනින් ද යන්න ඔවුන්ට රහසක් විය. මේ රහස දනගන්නට ඔවුන් හැම කෙනෙකුට ම අවශ්‍ය විය. වරින් වර ගහ ඒ පැත්තටත්, මේ පැත්තටත් හරවන ලද්දේ කෙසේ ද? යන්න ඔවුන් කිසිවකුට තේරුම්ගත නොහැකි විය.

Scanned by CamScanner

වාසනාවකට වගේ මේ කිසි ම ආරංචියක් පාලිත ගේ මවට හෝ පියාට හෝ ඒ වන විටත් දැනගන්නට ලැබී නැත. මේ සිද්ධියේ ප්‍රතිඵලයක් වශයෙන් පාලිත ලෙඩ විය. එපමණකුදු නො ව ඔහු ශරීර ශක්තියෙන් ද පිරිහී ගියේ ය.

ගමේ මිනිසුන් අතර සුළු සුළු ගොවිතැන් දියුණු විය. මුදලාලි ගේ කඩය දියුණු වන්නට පටන්ගත්තේ ඒ නිසාය. ගුණදස යම්කිසි රක්ෂාවක් ලැබී ගමෙන් පිට විය.

පාලිත ගේ අසනීපය දවසින් දවස වැඩි වුණා මිස ගුණයක් ලැබුණු බවක් කිව නොහැකිය. තමා උපන් ගමට තමා ගෙන් අයහපතක් විණැයි ගැමියන් අපවාද නඟතැයි යන සිතිවිලි ඔහු කෙරෙන් ඈත් කළ නොහැකි විය. අවසාන මොහොතේ තමන් ගේ ජීවිතය ආරක්ෂා කොට දුන් ගැමියන්ට ස්තුති කළ පාලිත ජල ප්‍රවාහය පිළිබඳ සැබෑ තත්ත්වය ඔවුනට අනාවරණය කළ යුතු යැයි තීරණය කළ බව මා සමඟ කී ය.

වෛද්‍යවරයාගේ අනුමැතිය ද ඇතිව ගැමියෝ කිහිප දෙනෙක් පාලිත ගේ ලෙඩ ඇඳ අසලට කැඳවන ලදහ. මුදලාලිත්, වඩු බාසුත් මේ හත් අට දෙනා අතර වූහ.

කාමරය ලස්සනට අස් පස් කොට තිබිණ. පාලිත ගේ අම්මාත්, තාත්තාත් කඳුළු බර නෙත්වලින් යුක්ත ව පාලිත ගේ මුහුණ දෙස බලා සිටිති.

'පුතා, ඔයාගේ කීමට ගමේ මිනිස්සු හුඟ දෙනෙක් ඇවිත් තියනවා. ඒ ගොල්ලන්ට කියන්න තියෙන දෙයක් කියන්න.'

'ඉස්සෙල්ලම මට සමාවෙන්න මගෙන් වැරැද්දක් වුණා නම්!'

'නැ නැ එහෙම වරදක් වෙලා නැ පුංචි මහත්තයා'

ඒ කඩේ මුදලාලි ගේ කට හඬ ය.

'ගිං ගඟ පටන් ගන්න තැන ඉඳලා ගිංතොට මෝදර යන තැන දක්වා ඕනෑම තැනක් ගැන කියන්න මම දන්නවා.'

රැස්ව සිටි ගැමියෝ එකිනෙකා ඔවුනොවුන් ගේ මුහුණු බලා ගත්හ.

'අවුරුද්දකට දෙකකට වරක් ගං වතුර ගලලා අපේ ගම් පළාත් විනාශ වෙනවා. ඒක නතර කරන්නෙ කොහොම ද කියලත් මම හොයා ගත්තා.'

'ඇයි පුංචි මහත්තයා ඕක අපට කියන්නෙ නැත්තෙ?'

'ඒක හුඟක් දිග කතාවක්, මම පස්සෙ කියන්නම්. දැන් මට කියන්න තියෙන්නෙ මේ ගඟ ඔහෙලාගෙ අයිතියක්. ඒක පටන්ගන්නේ කොතනින් ද? හරවන්න පුළුවන් මොන විධියට ද? කියල මම කියල දෙන්නම්. ඔහෙලා ඒක දන්න තො හිටියොත් වලස්මුල්ල තංගල්ල පළාත්වල මිනිස්සු ඒක දැනගත්තොත් ඔහෙලට සැඳහටම මේ ගඟ නැති ව යනවා. මට ඉස්සෙල්ලම ඕන ඒක කියල දෙන්න.'

හැම දෙනා තුළ ම පැවතියේ බලවත් නිශ්චලතාවයකි.

ගුහාව ඇතුළට ඇතුළු වන සැටි ඔහු විස්තර කළේ ය. ජල කඳ පටන් ගන්නා තැන ඔහු කියා දුන්නේ ය. එය වලස්මුල්ල පැත්තට හැරවිය හැකි සිදුර ගැන ද ඔහු විස්තර කළේය.

'පුංචි මහත්මයා එතනට ගියේ අර ඔක්කොම කඳු පනු කරල ද?'

'නෑ, නෑ, ඒ එක කන්දක්වත් පනු කරන්න ඕනෑ නෑ. මම ඒකට බොහොම කොට පාරක් හොයාගත්තා. මේ මගේ මල්ලි ජයදේව ඒ පාර දන්නවා. එයා ඒ පාර පෙන්නයි.

'දැන් අපිට මොකද කරන්න තියෙන්නේ?'

'ගහ හරවන්නට පුළුවන් අතිත් සිදුර සදහටම වහල දන්න ඕනෑ.'

'අප හෙට ම මේ වැඩය ආරම්භ කරමු. ගහ අපේ, ඒක කාටවත් දෙන්න බැ'යි මුදලාලි කී ය.

'පුංචි මහත්තයා, හොඳට නිඳගන්න. තුනුරුවන්ගෙ පිහිටෙන් ඉක්මනින් සනීප වෙන්න ඕනෑ. හෙට උදේ ම අපි වැඩේ පටන් ගන්නවා.'

සියලු දෙනාම පාලිතගේ ඇඳ ළඟට පැමිණ ආචාර කොට සුබ පතා විසිර ගියහ.

'ජයා, තමුසෙ හෙට උදේ ම පිටත් ව අපේ මිනිස්සු කරන වැඩ ගැන බලා ගෙන විත් මට කියන්න ඕනෑ.'

'හොඳයි, මම ඒක කරන්නම්.'

පසුද උදයෙහි මා හත්දියට පැමිණෙන විට එහි ගැමියෝ පනහක් හැටක් පමණ රැස් ව සිටියහ. ඔවුන් හැම කෙනෙකු

අනෝම උදැල්ලක් හෝ වෙනත් ආයුධයක් හෝ තිබිණ. මුද
ගම් පළාත ම එක්සත් ව නැගී සිටීම මගේ ආඩම්බරයට ද
හේතු විය. පොදු කරදරයක් පැමිණි විට වාද භේද අමතක
කොට සමගි වීම කවදත් ගමේ සිරිත විය.

# 6

'තමුසෙ බය වුණේ ඇයි?'

ලාම්පුවකුත් උදැල්ලකුත් ඇති ව කලින් ම ගුහාව තුළට රිංගා ගත් මිනිසා ටිකක් දුර ගොස් බියපත් ව ආපසු ආවේය.

'කවුද මිනිහෙක් ඇතුළෙ ඉන්නවා'යි

ඔහු කීය.

'ඒක නම් කවදාවත් වෙන්න බැරි වැඩක්. මේ ළමයි ගුහාව සොයා ගන්නට කලින් කවුද ඕයි එක මිනිහෙක්වත් මේක ගැන දැනගෙන හිටියයැ'යි කඩේ මුදලාලි කීය. අපි ගුහාව ඇතුළට ගොස් ඒ තුළින් නැඟෙන හඬට කන් දී සිටියෙමු. කවුරු හෝ වේවා ගුහාව ඇතුළට වැදුණු පිරිසක් මී මැස්සන් මෙන් වැඩෙහි යෙදී සිටින සැටි අපට පෙනේ.

'මිනිස්සු කවුරු වුනත් වැඩට දස්ස මිනිස්සු'

මුදලාලි කී ය. අපේ කිහිප දෙනකු අනෙක් පැත්තෙන් පැමිණ ගුහාවේ වහල මුදුනට නැඟී මොවුහු කුමක් කරන්නෝ දැයි පරීක්ෂාකර බලන්නට යැවීමු. මේ උපායෙන් අපට වුවමනා




Scanned by CamScanner

තුළේ කවුරුන් හෝ මේ යෙදී සිටින කාර්යය කුමක් දැයි හරිහැටි දැන ගැනීමය. මුදලාලිත් වඩු බාසුත් මමත් මේ කණ්ඩායමට අයත් වූවෙමි. වටේ කැරකී ගෙන එන විට අපට පෙනුනේ ගහ යළිත් වරක් වලස්මුල්ල පැත්තට ගලන බවය. ටික දිනකට කලින් මුහුණ පාන්නට වූ අමාරුකම්වලට නැවත වරක් මුහුණ පාන්නට වෙතැයි යන බිය මුදලාලි හා වඩුබාස් ද අතර පැවැති කතා බහෙන් මම තේරුම් ගතිමි.

'මේ ජෙන හැටියට ගුහාව ඇතුළේ සිටින්නේ අපේ හතුරෝ වෙන්නට ඕනෑ'යි වඩුබාස් කී ය.

'මම හිතන්නෙත් එහෙම ම තමයි. වෙන කිසිවකුට ගුහාව තුළට එන්නට වුවමනාවක් නෑ.'

බොහොම අමාරුවෙන් අපි කඳු වැටි නගිමින් බසිමින් තියමින ගුහාවේ වහලට නැඟ ගතිමු. කිසිවකුට නොදැනෙන සේ රහසින් සියල්ල බලා ගන්නට අපි පරෙස්සම් වූවෙමු. පියස්ස මුදුනට නැග ගැනීමෙන් පසු ඉතා ම පහසුවෙන් අවට නරඹන්නට හැකි වෙයි.

වලස්මුල්ල පැත්තෙන් ආ විශාල පිරිසක් උඩුගම හරහා ගලන ගහ නතර කොට ඒ තම ගම් ප්‍රදේශයට හරවනු පිණිස අමාරු කාරියක යෙදී සිටින බව පෙනෙන්නට තිබිණ. අපි කාරණය තේරුම් ගතිමු. එහෙයින් බොහොම නිශ්ශබ්ද අන්දමින්ට ආපසු ගුහාවේ ඉදිරි දෙරටුව කරා ගියෙමු. අපේ මිතුරන් දැන් අප මුහුණ පා සිටින බිහිසුණු තත්ත්වය ලෙහෙසියෙන් ම අවබෝධ කරදෙන්නට අපට පිළිවන් විය.

'ඒ ගොල්ලන් මේ රහස් දැනගත්තෙ කොහොමද?'

පසු සහන් බිය නිර්භාත්‍ය වී සිටිය ද අවසාන ප්‍රශ්නය ඇසුවේ ය.

'මම දැන් ප්‍රශ්නයට හරියට ම උත්තර දෙන්නම්. මහතා ද ඊයෙ පාලිත පුංචි මහත්මයාගේ ඇඳ ළඟට අපි දහ දොළොස් දෙනෙක් ගියා. පාලිත මහත්මයා ඔක්කොම රහස් කියල අවර වුනා විතරයි. කවුරු හරි එක් කෙනෙක් නැගිටලා ගියා. ඊත් පාලිත මහත්තයා ඇහැව්වා කවුද ගියේ කියලා. අපි ඒ වේලාවෙ ගණන් ගත්තෙ නෑ නේද? ඔන්න ඒ නැගිටලා ගිහිල්ල තියෙන්නෙ අපේ හතුරෙක්, ඒ ගොල්ලන් නිතර ම ඇවිත් අපේ පළාතෙ තොරතුරු හොයල තියෙනවා. මාත් එක්ක ගමේ මිනිසුන් කිහිප දෙනෙක් ම කියල තිබුණ නාඳුනන මිනිස්සු හුඟ දෙනෙක් ගම පුරා ඉන්නවා කියල. දැන් තේරෙනවා අපි අපේ ගමට ආදරේ කරනවා මදියි. ඒ ගොල්ලන් තමන්ගෙ ගමට කොච්චර ආදරේ ද? ගමට රටට ආදරේ නැති මිනිහෙක් ගෙන් ඇති වැඩේ මොකක්ද?'

මුදලාලි දිගටම කතා කරන අන්දම මා බලා සිටියේ සියලු දෙනා ම ඔහු ගේ කතාව හිස පාත් කොටගෙන අසා සිටි නිසා ය.

'අපිට හැමදම නිකම් වතුර ලැබිච්ච නිසා අපි වතුරෙන් ප්‍රයෝජන ගත්තෙ නෑ. ඔහේ මුහුදට ගලාගෙන යනවා. අක්කර දහස් ගණන් පුරන් වෙලා. පරණ මෝඩකම් ගැන කතා කරලා වැඩක් නෑ. දැන් කරන්න තියෙන්නෙ මේ ගොල්ලන් පන්නල අපේ ගඟ අපි අයිති කරගන්න එකයි.'

ඒ නීවේ වලු බාස් ය.

'අපි කොහොමද ඒ ගොල්ලන් පන්නන්නෙ?'

එක වරට ම කට හඬවල් ගණක් ඇසෙන්නට විය.

'ඒ ගොල්ලන් ගුහාවට ඇතුල්වුණ දොරටුව වහමු. ඊට පස්සෙ ඒ ගොල්ලො අපේ සිරකාරයෝ. අපි සමාව දෙන්නෙ අපි කියන දේට එකඟ වෙනව නම් විතරයි.'

මම පැහැදිලි ලෙස ඔවුන්ට කීවෙමි.

'බොහොම හරි! ඒක තමා කරන්නට තියෙන්නෙ. මේ ළමයි පොත්වල තියෙන පැරණි යුද්ධ කතන්දර කියවල ඒ විධියට රඟපාන හැටි.!'

මුදලාලි දූනටමත් පිරිසේ නායකයා වී හමාරය. ඔහුගේ එකඟ වීමෙන් පසු සියලු දෙනාම මගේ යෝජනාව පිළිගත්හ.

අපේ පිරිස කඩියන් මෙන් ක්‍රියාශීලී වූහ. අවට ගුහාවන්ගෙන් එකතු කර ගත් ලේ ගෙන ඔවුන් ඇතුළු වූ දොරටුව අවහිර කළහ. මාසයක් වත් එක දිගට ම වැඩ කිරීමෙන් මිස ඔවුන්ට මේ දොරටුව පාදගත නොහැකි බව අපි දනිමු. ඔවුන් අපේ සිරකරුවන් බවට පත් වූහයි යන හැඟීම් ඇති වීමෙන් පසු අපේ සිත්වලට මඳ අස්වැසිල්ලක් ඇති විය.

අපි යළිත් කඳු මුඳුන් පීරාගෙන ගුහාවේ වහලට එහායින් වූ කණ්ඩියට නැඟ ගතිමු.

Scanned by CamScanner

ඒ පිරිස නො නැවතී කාර්යයෙහි නියුක්ත ව සිටියහ. අපේ ඇස් තිහක් ඔවුන් වෙත යොමු වී තිබෙන වගක් ඔවුහු නො දත්හ.

'ඒ ගොල්ලන්ට ඇහෙන්න ලොකු ශබ්දයක් කරන්න ඕනෑ.'

මුදලාලි කී ය. ඔහුගේ යෝජනාව හරිය. ඒ වෙලාවේ හැටියට කළ යුතු ව තිබුණේ එය බවට සැකයක් නැත. අපි සියලුදෙනාම එකවර හඬ නඟන්නට වීමු. අපේ හඬින් ඔවුහු බය බිරාන්ත වී ගියහ. සමහරකු ගේ අත්වල තිබූ උදලු අතින් ගිලිහිණි. කාගේත් මුහුණු මැලවී ගොස් තිබිණ.

ඒ ගොල්ලන් උඩ බලන හැම මොහොතකම ඔවුන්ට පෙනුණේ ඔවුන්ගේ සතුරෝ ය.

'යාළුවා මේක භයානක වැඩක්. ගින්දරත් එක්ක සෙල්ලම් කිරීම හුඟක් භයානකයි. භය හතර නොදන්නා පුංචි ළමයි දෙන්නෙක් සෙල්ලමට කළ වැඩකින් අයුතු ප්‍රයෝජන ගන්න හදන්න එපා. මේ ගඟ තමුසෙලාට අයිති නෑ කියල තමුසෙල දන්නව නේ? ඇයි තමන්ට අයිති නැති දෙයක් බලෙන් අයිති කරගන්න හදන්නෙ? කොයි ආගමකට වත් ඒක එකඟ නෑ නේද? තමන්ගෙ වර පුරුෂයෙක් එදා රෑ එවලා මේ රහස දැන ගත්ත පළියට හිතන්න එපා ගඟ තමන්ට අයත් කර ගන්න පුළුවන් කියලා. මේක සදාකාලිකව ම අපේ උරුමයක්, ඒ නිසා අපේ ගම් පළාත්වලට දිය ගැලූ සිදුර වහන්න තමුසෙලාට කිසිම අයිතියක් නෑ.'

'මෙච්චර කල් ගැලූ ... රටවල් පාළු වෙලා. තමුසෙලාට එහෙ... වෙලා නෑ. ඒ නිසා ගඟ කලින් ගැලූ විධියට ගලවා... සලස්වා මේ භේදය අවසන් කර ගන්නට තමුසෙලා කැමති ද?'

ඒ කතා කළේ වඩු බාස්ය.

'නෑ නෑ නෑ අපි එකඟ නෑ.!'

ඔවුහු සියලු දෙනාම එක හඬින් කීහ.

'හා එහෙම ද? හොඳයි එහෙම නම් කමක් නෑ. තරහ වෙන්න එපා. තමුසෙලා දැනටමත් හිරකාරයෝ. ආයෙත් දිය පාර අපේ ගමට හරවා කාරණය මෙතනින් හමාර කරන තුරු ඔතනින් හෙලවෙන්නට වත් හිතන්න එපා.'

අනුකම්පා විරහිත දළදඬු අන්දමේ වචන වලින් මුදලාලි කතා කළේ ය.

ඔවුන් වහා ඇතුළු වන දෙරටුව කරා යන සැටි අපි බලා සිටියෙමු. බලාපොරොත්තු නොවූ අන්දමින් ඒ අවහිර කොට තිබූ බව ඔවුන්ට දක්නට ලැබිණ.

Scanned by CamScanner

'ඉක්මනින් උස්කෝප්ප හා උදලු අරගෙන වරෙල්ලා' යි තරුණ පණේ එකෙක් කෑ ගැසී ය. එහෙත් ඔවුන්ගේ උනන්දුවෙන් වැඩක් නො වී ය. ක්‍රමානුකූලව බඳින ලද ගල් වැටි ඉවත් කිරීමට දවස් කිහිපයක් ගත වන බව සැකයක් නැත.

'දන් වත් දිය පාරේ අයිතිය අපට දෙන්නට කැමති ද?'

අපි එකහඩින් ඇසීමු.

'නෑ නෑ අපි කොහෙත්ම ඒ යෝජනාවට කැමති නෑ.'

ඔවුහු අවධාරණයෙන් ම කියා සිටියහ.

'ඒ ගොල්ලන්ට තීරණයකට බසින්නට කල් දෙමු. අද දෙන උත්තරය නෙවී, හෙට උදේට එයට වෙනස් උත්තරයක් දේවි.'

ඒ කීවේ ගමේ පාසැලේ ගුරුවරයාය.

අපි ගෙවල් බලා ගියෙමු. මා ආපසු යන විට බොහෝ වේලාවක් ගත වී තිබෙන බව පාලිත ගෙන් දැනගන්නට ලැබිණ. මේ නිසා ම ඔහු මා එනතුරු පෙරමග බලා සිටියේ ය. සම්පූර්ණ කතාව ම ඔහුට විස්තර කිරීමෙන් පසු තවත් කලබල විය.

'මොනව? ඔවුන් ගුහාව ඇතුළේ සිර කළා!'

'ඔව්!'

'හොඳයි මම මේ අරගලය ඉවරයක් කරන්නම් කෝ!'

Scanned by CamScanner

සීතල සුළං නො වදින ලෙස ශරීරය උණුසුම් කරගෙන ගුවතට යෑමෙන් අනතුරක් සිදු නොවේ යයි දෙස්තර මහතා කී ය. එ නිසා පාලිත මනාලෙස ශරීරය උණුසුම් කරගෙන ගෙයින් බැහැර වූයේ ය. මම ද ඔහු සමඟ පිටත් වූවෙමි. ගුහාව කරා යන අතර මඟ දී ගම් වැසියෝ බොහෝ දෙනෙක් අපට මුණ ගැසුණහ. අපි සියලු දෙනාම ඉක්මන් ගමනින් කඳු මුදුනට නැඟ ගතිමු. අප එයට නගින විට පහත සිටි මිනිසුන් කරන සාකච්ඡාවක් අපට ඇසෙන්නට විය.

"ඒ ගොල්ලන් දිය පහර අයත් කර ගත්තාවෙ. ඒක අපට අයිතිවෙලා තිබුණෙත් නැනෙ? අපි පණ බේරගෙන යමු."

අපට ඇසුණු වචනයි ඒ.

ගුහාව ඇතුළ බලන විට කලින් දින සවස් වරුවේ මෙන් නොව ඔවුන්ගේ මුහුණු ශෝකී ස්වරූපයක් ගෙන තිබිණි. නියමිත වේලාවට ආහාර පාන නොලැබීමෙන් ද විඩාව නිසාද ශෝකී බව තව තවත් දියුණු තියුණු විය. ඇතැමෙක් ඇඳගෙන සිටි ඇඳුම් බිම අතුරා ඒ මත වැතිර සිටියහ.

"මහත්වරුනි, වතුර පාර තමුන්නාස්සේලා ගේ ගම් පළාතට හැරවීමට අපි කටයුතු කරනවා! ඒ ඉක්මනින් හමාර වේවි! ඒ ඉවර වූ වහාම අප ගලවා හරින්නට ඕනෑ"

එකෙක් කී ය.

"ඇත්ත වශයෙන් ම අපි පොරොන්දුව ඉෂ්ට කරනවා."

පැය බාගයක් ගත වන්නටත් කලින් දිය පහර කලින් ගැලූ අන්දමින් සිහින් සෙරෙන් අපේ ගම් පෙදෙස හරහා ගලා යන්නට විය. අපි ඔවුන් නිදහස් කෙළෙමු. ඔවුන් ගුහාවෙන් පිට වූයේ හොඳ හිතින් නොවන බව නම් සහතික ය.

'මේ දිය පහරට අපි අරගල කරගන්න ඕනෑ නෑ. හතුරන් වෙන්න ඕනෑ නෑ. අපි කාටත් මේ ජලයෙන් ප්‍රයෝජන ගන්න පුළුවන්. ඒක කරන්නේ කොහොමද කියල බලන්න තමයි මම ගඟ ඒ පැත්තට මේ පැත්තට වරින් වර හැරෙව්වේ. මේ ඔක්කොම සමගි වෙනව නම් දෙගොල්ලට ම ගඟෙන් ප්‍රයෝජන ගන්න කියල දෙන්න මට පුළුවන්.

රෝගාතුර ව සිටිය ද පාලිත ගේ කටහඬ පැහැදිලි ය. එඩිතර ය. කවුරුත් ඔහුගේ වචන විශ්වාස කරතැයි මට සිතිණ.

'සමගි වෙන්න අපි කැමති යි. ගඟ අපිටත් ලැබෙනව නම් සමගි වෙන්න අපි කැමැති යි.'

ඔවුහු එක් හඬින් කෑ ගැසූහ. පාලිත සෙමෙන් සෙමෙන් ඔහු ගේ යෝජනා ක්‍රමය විස්තර කළේ ය. කලක් රෝගාතුර ව සිටි නිසා වරින් වර ඔහු කතාව නතර කොට මහන්සි අරින්නට වූයේ ය.

'හැබැයි මට අවුරුද්දක් කල් දෙන්න ඕනෑ.'

'අපි කැමතියි.'

ගිං ගඟේ ජලය කතරගම තෙක් ගලාගෙන යන්නට සැලැස්වීමේ යෝජනාව මුලින්ම ඉදිරිපත් කළේ එදා කුඩා ළමයෙකු වූ පාලිත ය. අද ඒ යෝජනා ක්‍රමය භාර ව සිටින ඉංජිනේරුවා ද පාලිතය.

නිමි.

Scanned by CamScanner